# වාර්ෂික වාර්තාව
# 2023-24



**කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම**

**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

# සාර්ථකත්වය අත් විඳිමු

අපගේ සංදර්භය තුළ සාර්ථකත්වය අත් විඳීම යන්නෙන් අප අදහස් කරනුයේ සිය මූල්‍ය ඉතිහාසයේ ඉහළම ලාභය ලබා ගැනීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කරමින් අපගේ තේ නිෂ්පාදන කර්මාන්තශාලාවල සාධන සූක්ෂමව ඇගයීමයි. මෙම කාර්යසාධනය කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලි පමණක් නොව උපාය මාර්ගිකව වෙළඳපොළ ස්ථානීකරණය, ගුණාත්මකභාවයේ විශිෂ්ඨත්වය සහ නිපුණ කළමනාකරණය පිළිබිඹු කරයි.

මෙම ජයග්‍රහණය තීව්‍ර කරනුයේ දශක තුනක අපගේ කැපවීම, වර්ධනය සහ ඔරොත්තු දීමේ හැකියාව කැටි කොට දක්වන සුවිශේෂී සන්ධිස්ථානයක් වන අප කර්මාන්ත ශාලාවේ 31 වැනි සංවත්සරයයි. තේ නිෂ්පාදනයේ අපගේ ගමන් මග නව්‍යකරණය, ගුණාත්මකබව වෙත කැපවීම සහ වෙනස් වන පාරිභෝගික තේරීම් කෙරෙහි ප්‍රතිචාර දැක්වීම මගින් සලකුණු කර තිබේ.

මෙම 31 වැනි සංවත්සරය සමරද්දී අපි අපගේ අතීත ජයග්‍රහණ සිහිපත් කරනවා පමණක් නොව ගතික තේ නිෂ්පාදන ලෝකය තුළ නව ප්‍රගමන සහ අවස්ථා ග්‍රහණය කර ගනිමින් අනාගත ප්‍රයත්න සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නෙමු. මෙම සංවත්සරය විශිෂ්ඨත්වය කෙරෙහි අපගේ චිරස්ථායී කැපවීම පිළිබඳ තහවුරුවක් හා අපගේ සාර්ථකත්වයේ අනිවාර්ය කොටස්කරුවන් වූ අප කණ්ඩායම, රජය සහ පාරිභෝගිකයන් වෙත කෘතවේදීත්වය පළ කිරීමේ අවස්ථාවක් වේ.

**රු. මිලියන 1,802**
**ශුද්ධ විකුණුම් (2023-24)**

**3,111**
**අමු දළු සැපයුම්කරුවෝ (2023-24)**

**4**
**තේ කර්මාන්ත ශාලා**

**රු. 12.06**
**කොටසක් සඳහා ඉපැයුම් (2023-24)**

මෙම වාර්ෂික වාර්තාව අපගේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක:
www.kalubowitiyanatea.lk

# පටුන

## පූර්විකාව


04 විශේෂ මූල්‍ය සිදුවීම්
05 මූල්‍ය නොවන විශේෂ සිදුවීම්
06 වාර්තාව පිළිබඳව
07 දැක්ම හා මෙහෙවර
08 ආයතනික පැතිකඩ
09 අප ගැන
10 සභාපතිතුමාගේ සමාලෝචනය
12 අධ්‍යක්ෂ මණ්ඩලය
14 ආයතනික කළමනාකාරිත්වය
15 අපගේ නිෂ්පාදන
18 සංවිධාන ව්‍යුහය
20 අපගේ ගමන්මග


## කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය


23 අපගේ පරිණාමනය
24 වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය
25 මූල්‍ය සමාලෝචනය
26 පාර්ශවකරුවන්ගේ සම්බන්ධතාවය
27 අවදානම් කළමනාකරණය
28 මෙහෙයුම් තොරතුරු
30 කර්මාන්තශාලා අනුව ලාභය/(අලාභය)
31 මාසික තේ නිෂ්පාදනය
32 වාර්ෂික තේ නිෂ්පාදනය
33 මාසික අමු දළු ලබා ගැනීම
34 වාර්ෂික අමු දළු ලබා ගැනීම
35 සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය
37 විකුණුම් සාමාන්‍යයන් උන්නතාංශය සමඟ සංසන්දනය කිරීම
39 සම්මාන සහ පිළිගැනීම
40 ඉහළම මිල ගණන් – 2023-24 වර්ෂය
42 ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්
43 අධ්‍යක්ෂවරයාගේ වාර්තාව
45 විගණන කමිටු වාර්තාව


## මූල්‍ය වාර්තා


48 විගණක වාර්තාව
52 ලාභ/(අලාභය) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
53 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
54 ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
55 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
56 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
74 දස අවුරුදු සාරාංශය

# විශේෂ මූල්‍ය සිදුවීම්

වගුව – 01

| මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | 2023/24 (රු.) | 2022/23 (රු.) |
|---|---:|---:|
| ශුද්ධ විකුණුම් | 1,802,165,017.30 | 2,635,413,672.26 |
| විකුණුම් පිරිවැය | (1,747,661,088.10) | (2,285,165,802.89) |
| **දළ ලාභය** | **54,503,929.21** | **350,247,869.37** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 49,849,950.33 | 60,406,356.64 |
| **මෙහෙයුම් වියදම් වලට පෙර ලාභය/(අලාභය)** | **104,353,879.54** | **410,654,226.01** |
| පරිපාලන වියදම් | (63,425,440.50) | (72,369,962.37) |
| විකිණීම සහ බෙදා හැරීම සහ අනෙකුත් වියදම් | (4,031,338.74) | (1,237,181.17) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලාභය/(අලාභය)** | **36,897,100.30** | **337,047,082.47** |
| මූල්‍ය ආදායම | 32,494,111.89 | 19,694,964.91 |
| මූල්‍ය වියදම් | - | (9,754,534.21) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **32,494,111.89** | **9,940,430.70** |
| **බදු පැනවීමට පෙර ශුද්ධ ලාභය/(අලාභය)** | **69,391,212.19** | **346,987,513.17** |
| බදු පැනවීම | (13,816,704.98) | (126,186,737.83) |
| **බදු පැනවීමෙන් පසු ශුද්ධ ලාභය** | **55,574,507.21** | **220,800,775.34** |
| කොටසකට ඉපැයීම් | 12.06 | 47.92 |

ප්‍රස්තාරය – 01

ශුද්ධ විකුණුම්

(රු. මිලියන)




ප්‍රස්තාරය – 02

මෙහෙයුම් වියදම් වලට පෙර ලාභය/(අලාභය)

රු. මිලියන)




ප්‍රස්තාරය – 03

බදු පැනවීමට පෙර ශුද්ධ ලාභය/(අලාභය)

රු. මිලියන)




ප්‍රස්තාරය – 04

බදු පැනවීමෙන් පසු ශුද්ධ ලාභය

(රු.)




# මූල්‍ය නොවන විශේෂ අවස්ථා

ප්‍රස්තාරය – 05

අමු දළු සැපයුම්කරුවන්




මුළු එකතුව

3,111 සැපයුම්කරුවන්

ප්‍රස්තාරය – 06

අමු දළු ලබා ගැනීම




මුළු එකතුව

6,332,676 කි.ග්‍රෑ

ප්‍රස්තාරය – 07

තේ නිෂ්පාදනය




මුළු එකතුව

1,301,737 කි.ග්‍රෑ

වගුව – 02

| කර්මාන්තශාලාව | අමු දළු සැපයුම්කරුවන් (සංඛ්‍යාව) | අමු දළු ලබා ගැනීම (කි.ග්‍රෑ) | තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ) |
|---|---:|---:|---:|
| ● – කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | 2,375 | 4,041,473 | 858,881 |
| ● – දැරංගල තේ කර්මාන්තශාලාව | 559 | 1,042,914 | 208,325 |
| ● – හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව | 86 | 533,677 | 109,986 |
| ● – මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව | 91 | 631,698 | 124,545 |

2023/24 දී ශ්‍රී ලංකා තේ ආනයනකරුවන්



# වාර්තාව ගැන

## කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව පිළිබඳව

රට ප්‍රත්‍යාස්ථිතික ප්‍රතිසාධනයක් කරා මෙහෙයවීමේදී තම කාර්යභාරය ඉටු කිරීමට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම අපේක්ෂා කරයි. අපගේ 31 වන සංවත්සර වසර තුළ 2024 මාර්තු 31න් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා අපගේ 2023/2024 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. අපගේ පාර්ශවකරුන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම පිණිස අපගේ මෙහෙයුම් පරිසර සංදර්භය තුළ උපාය මාර්ග මෙහෙයවනු ලැබූයේ කෙසේද යන්න පිළිබඳ සාධාරණ විස්තරයක් සපයන අතරම සමාගමේ මූල්‍ය, සමාජීය, පාරිසරික සහ පාලන කාර්යසාධනය සම්බන්ධයෙන් සංක්ෂිප්ත, සාකල්‍යය සහ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට මෙම වාර්තාව අරමුණ කරයි.

## විෂය පථය සහ සීමාව

මෙම වාර්ෂික වාර්තාව කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ මෙහෙයුම් ආවරණය කරයි. සමාගම වාර්ෂික වාර්තාකරණ චක්‍රය යොදා ගන්නා අතර මෙ වාර්තාව 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ප්‍රකාශයට පත් කරන ලද පෙර වාර්තාවේ දිගුවකි. 2007 අංක 07 දරන සමාගම් පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මහා භාණ්ඩාගරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ මගින් නියම කර ඇති පරිදි මූල්‍ය ගිණුම්කරණ පද්ධති සහ කළමණාකරණ තොරතුරු පද්ධතිවලින් ලබා ගත් මූල්‍ය සහ මූල්‍ය නොවන දෙයාකාර තොරතුරු මෙමගින් සපයා ඇත. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන මතයක් ප්‍රකාශ කරනු පිණිස ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත.

## වාර්තාකරණ රාමුව

ශ්‍රී ලංකා රජයේ අවශ්‍යතා සමගින් ගෝලීයව පිළිගත් පහත දැක්වෙන වාර්තාකරණ රාමු අනුව අප කටයුතු කරන අතර මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලැබූ ආයතනික වාර්තාකරණ මාර්ගෝපදේශයන්හි යහපත් පරිචයන් සමග අප වාර්තාකරණය සම්බන්ධීකරණය කිරීමට අප කැපව සිටින්නෙමු.

වගුව – 03

| වාර්තාකරණ රාමු, ප්‍රමිති සහ මාර්ගෝපදේශ | අභ්‍යන්තර සහතිකකරණය | බාහිර සහතිකකරණය |
|---|---|---|
| **මූල්‍ය වාර්තාකරණය** | | |
| ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සමාගම් පනත 2007 අංක 7 | කළමනාකරණය විසින් ස්ථාපිත කර ඇති සහ විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන අංශය විසින් ඇගයීමට ලක් කරන ලද අභ්‍යන්තර පාලනයන්. | ජාතික විගණන කාර්යාලය |
| **ආඛ්‍යාන වාර්තාකරණය** | | |
| රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික වාර්තා සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ | කළමනාකරණය විසින් සමාලෝචනය කර මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී. | ජාතික විගණන කාර්යාලය |
| **ආයතනික පාලනය** | | |
| ආයතනික පාලනය පිළිබඳ යහපත් පරිච සංග්‍රහය ශ්‍රී ලංකාව රාජ්‍ය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ | කළමනාකරණය විසින් සමාලෝචනය කර මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී. | ජාතික විගණන කාර්යාලය |

## වැඩිදියුණු කිරීම් වාර්තා කිරීම

- තිරසර වාර්තාකරණය, අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් ඇතුළත් කිරීම.
- පරිණාමන උපායමාර්ග සහ පාර්ශවකාර සබඳතා පිළිබඳ වැඩි අවධානය.

## ආයතනික වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වගකීම

මෙම වාර්තාවේ නිරවද්‍යතාව ආරක්ෂා කිරීම පිණිස වන තම බැඳීම අධ්‍යක්ෂ මණ්ඩලය පිළි ගනියි. 2023/24 වාර්තාව සමාගමේ ඒකාබද්ධ කාර්යසාධනය නිවැරැදිව පෙන්නුම් කරන බවත් අදාළ සියලු ද්‍රව්‍යමය කරුණු ආවරණය කරන බවත් අප මෙයින් සහතික කරන්නෙමු. එසේම ශ්‍රී ලංකාවේ මහා භාණ්ඩාගාරය විසින් දෙනු ලැබූ උපදෙස් ප්‍රකාරව වාර්තාව සකස් කරනු ලැබූ බව අප තවදුරටත් සහතික කරන්නෙමු.

## පසු විපරම

ඔබගේ චින්තන හා අදහස් අප සැබවින්ම අගය කරන අතර අපගේ වාර්ෂික වාර්තාවේ ප්‍රමිතිය සහ පඨනීයතාව අඛණ්ඩව ඉහළ නැංවීමට අප කැපව සිටින්නෙමු.

ඔබේ අදහස් පහත ලිපිනයට යොමු කරන්න.
**කළමනාකරණ අධ්‍යක්ෂ,**
කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම,
අංක 53, රත්නායක පාර, පැලවත්ත,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.







# දැක්ම හා මෙහෙවර

## දැක්ම

හොඳම ශ්‍රී ලාංකික සිටීසී හා සම්ප්‍රදායික තේ නිපදවීමේ හා අලෙවි කිරීමේ වඩාත්ම පිළිගත් ආදර්ශය බවට පත්වීම.

## මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඉහළ ගුණාත්මකබවින් යුත් රසවත් හා පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකේය තේ නිෂ්පාදනය කිරීම.

# ආයතනික පැතිකඩ

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමිත බැඳීම් සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබූයේ සී.ටී.සී. තේ නිපදවීම සඳහා වන අතර කොටසක් රු.10 බැගින් තක්සේරු කරන ලද කොටස් මිලියන පහක් ලෙස රුපියල් මිලියන 50කින් සමන්විත ආරම්භක ප්‍රාග්ධනයකින් එය 1994 අගෝස්තු 1 වන දින වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉන්දීය ණය ආධාර යටතේ ආරම්භක ප්‍රාග්ධනය සපයන ලදී. ඒ අන්දමින්ම ඉන්දීය ණය ආධාර යටතේ අපගේ දෙවන කර්මාන්ත ශාලාව වූ දැරංගල තේ කර්මාන්ත ශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කරන ලදී. කලින් තේ ශක්ති අරමුදල යටතේ පැවැති අපගේ තෙවන කර්මාන්ත ශාලාව වූ හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව ලාභ බෙදා හදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පවරන ලදී. තමන්ගේම අරමුදල් යොදා ගනිමින් සමාගම මෙම කර්මාන්ත ශාලාව නැවැත ස්ථාපිත කරනු ලැබූ අතර හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අළුතින්ම එකතු වූ මැණික්දිවෙල කර්මාන්ත ශාලාව කලින් තේ ශක්ති පදනමට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ඡන්ද කොට්ඨාශයේ මැණික්දිවෙල ගම්මානයේ පිහිටා ඇත. මෙම කර්මාන්ත ශාලාව නැවැත ස්ථාපිත කිරීම සඳහා ද සමාගම තමන්ගේම අරමුදල් භාවිතා කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගත් තෝරාගත් අමු දළු යොදා ගනිමින් සමාගම ආසන්න වශයෙන් ඉතා උසස් තත්ත්වයේ තේ කිලෝග්‍රෑම් මිලියන 1.5 ක් නිපදවයි.

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව කැපීම, ඉරීම සහ රැළි ගැස්වීම යන ක්‍රියාවලිය භාවිතා කරමින් සී.ටී.සි. තේ වර්ග නිපදවන අතර දැරංගල, හිනිදුම සහ මැණික්දිවෙල කර්මාන්ත ශාලා සම්මත සම්ප්‍රදායික ක්‍රියාවලිය යොදා ගනිමින් පත්‍රිය සහ කුඩා ශ්‍රේණි තේ වර්ග පෙළක් නිපදවයි. කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට අයත් 4 ISO 22000; 2018 සහතික ලත් කර්මාන්ත ශාලා මගින් ගෝලීය වෙළඳපොළ සඳහා උසස්ම තත්ත්වයේ නැවුම් ලංකා තේ නිපදවන අතර දිවයිනේ ප්‍රමුඛතම සීටීසී තේ නිෂ්පාදකයා ලෙස කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ සුදුසුකම්වලට සැලකිය යුතු සන්නාම වටිනාකමක් එකතු කරයි. ලෝක මට්ටමේ තේ නිෂ්පාදයකු වීම සඳහා වන සිය කැපවීම වෙර ගන්වමින්, යහපත් නිෂ්පාදන පරිචයන්ට අතිරේකව, කළුබෝවිටියාන සමාගම ග්ලෝබල් ගැප් රාමුව, RA/UTZ ප්‍රමිති සහ මාර්ගෝපදේශ ඇතුළුව ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත නිෂ්පාදන පරිචයන් යොදා ගෙන තිබේ.

සමාගමේ තේ නිපැයුමෙන් 90% ක් පමණ තැරැව්කරුවන් හරහා කොළඹ තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර සුළු ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ, කර්මාන්ත ශාලාවල සහ දීප ව්‍යාපත්ව පිහිටා ඇති අලෙවි මධ්‍යස්ථාන හරහා දේශීය වෙළඳපොළ තුළ අලෙවි කරනු ලැබේ.

සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව සමාගමේ විධිනියෝගය පහත දැක්වෙන පරිදි වේ:

- වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීම, පිරිසැකසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය සිදු කිරීම.
- තේ සිටුවීම, වගා කිරීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.








# අප පිළිබඳව

**අපගේ තේ කර්මාන්ත ශාලා දිවයිනේ පහත රට බස්නාහිර මධ්‍යම කලාපවල පිහිටා ඇති අතර ජාතික තේ නිෂ්පාදනයට 0.63% ක දායකත්වයක් ලබා දෙමින් ඉහළම ගුණාත්මකබවින් යුතු තේ කිලෝග්‍රෑම් මිලියන 1.5 ක් නිපදවයි.**

**වර්ෂය තුළදී ඉහළම මිල ශ්‍රේණිගත කිරීම් 69 ක් සාධනය කර ගනිමින් අප කර්මාන්ත ශාලා ඉහළම ගුණාත්මකබවින් යුත් තේ නිපදවීය. අනෙකුත් තරඟකාරී තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා අතුරින් අනගිතම ගුණාත්මකබවින් යුතු සීටීසී තේ මිල සැලකීමේදී අපි එම කර්මාන්තයේ ප්‍රමුඛයා වන්නෙමු. වසර 30 කට වැඩි ගණනක් කොළඹ තේ වෙන්දේසියේ පහතරට උන්නතාංශ සඳහා ඉහළම ස්ථානය අප දිගින් දිගටම හොබවා ඇත්තෙමු. අප කර්මාන්ත ශාලාවෙහි සේවකයන් 3,500 ක් පමණ සේවය කරන අතර වඩාත්ම ආකර්ෂණීය මිල ගණන්වලට අමු දළු මිලදී ගැනීම මගින් අප 15,000 කට වැඩ පිරිසකගේ සමාජීය හා ආර්ථික ප්‍රගතිය සඳහා උපකාර කර ඇත්තෙමු.**



### දළු නෙලීම

එක් එක් ක්ෂෙත්‍රයෙන් දින 5 සිට 8 දක්වා කාල පරාසයකින් යුතුව නිතිපතා පදනමකින් අමු දළු නෙලා ගනු ලැබේ.



### මැලවීම

එම දළු කර්මාන්ත ශාලාවට ලැබුණු විගස, ඒවායේ බර කිරා දොරු මත අතුරනු ලැබේ.



### වියළීම

වියළිමේ මූලික අරමුණ වන්නේ තෙතමනය නිස්සාරණය සහ පැසීම වැළැක්වීමයි. පැසුණු දළුවල 45% සිට 50% දක්වා තෙතමනයක් අඩංගු වේ.



### ඇකිළීම

මෙය කොළ ඇඹරීමේ සහ දළුවල සෛල බිත්ති පිපිරීමට සලස්වා දළුවේ ඇති යුෂ පත්‍රය මතුපිටට ගෙන ඒමේ ක්‍රියාවලියයි.



### පැසවීම

තේ යුෂ පැසවීම කළු තේ නිෂ්පාදනයේ අත්‍යාවශ්‍ය ක්‍රියාවලියකි.




### වර්ග කිරීම (හැළීම)

සිසිල් කිරීමෙන් පසුව, දාහක තේ වෙළඳ පොළ ඉල්ලුම පරිදි ප්‍රමාණය සහ හැඩය අනුව වර්ග කරනු/හලනු ලැබේ.

# සභාපතිතුමාගේ සමාලෝචනය




**හිතවත් පාර්ශවකරුවනි,**

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ අභිනවයෙන් පත් වූ සභාපතිවරයා ලෙස මා ඔබ අමතනුයේ අපේක්ෂාවන් රැසක් පෙර දැරිවය. 2024 දෙසැම්බර් මාසයේ රාජකාරී බාර ගැනීමෙන් අනතුරුව, 2023/24 මූල්‍ය වර්ෂය සඳහා අතීතානුයෝගීව වුවත් මා මේ සමාලෝචනය ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. මෙම කාල වකවානුව තුළ මම සෘජුවම ආයතනයේ පාලනය අතැතිව නොසිටිය ද, මම සමාගමේ ගමන් මග සමීපව නිරීක්ෂණය කළ අතර කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව අභියෝග හමුවේ නොසැලෙන සිය ගුණය මනාව පෙන්නුම් කර ඇති බව මා පැවසිය යුතුමය. අභියෝගාත්මක වූ ආර්ථික වටපිටාවක් මධ්‍යයේ පවා, දුෂ්කරතාවයන් සාර්ථකවීමේ අවස්ථා බවට හරවා ගනිමින් හා කැපී පෙනෙන ප්‍රතිඵල අත් කර ගනිමින්, එය අපේක්ෂිත ඉලක්ක සපුරාගෙන ඇත. කර්මාන්ත ශාලාව පෙන්නුම් කර ඇති ශක්තිය හා අප්‍රතිහත ධෛර්ය, සැබවින්ම දිරි ගන්වන සුළු අතර එය එහි චිරස්ථායී විශිෂ්ඨත්වය සහ නොසැලෙන කැපවීම පිළිබඳ සාක්ෂියකි.

තේවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, එහි ප්‍රවර්ධනය හා විකුණුම් ප්‍රයත්න පුළුල් කිරීම සහ කර්මාන්තයේ සිය මිනුම් ලකුණ පවත්වා ගැනීම සඳහා වූ එහි කැපවීම හා දැඩිව බැඳී ඇත්තේ සීටීසී තේ ය. රු. මිලියන 1,802 ක ආදායමක් සහ රු. මිලියන 55 ක ශුද්ධ ලාභයක් සහිතව සමාගම කැපී පෙනෙන මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන තිබේ.

විශේෂයෙන්ම අත්‍යවශ්‍ය මොහොතක, වටිනා විදේශ විනිමය උත්පාදනය තුළින්, සමාගම ජාතික ආර්ථිකයට දැක්වූ දායකත්වය පිළිබඳව මම වෙසෙසින්ම ආඩම්බර වෙමි. සත්‍ය වශයෙන්ම, අතීතයේ සිදුවූ වැරදි ආවර්ජනය කිරීම හා ඒවායෙන් පාඩම් උගැනුම වර්ධනය සඳහා තීරණාත්මක වන අතර එය අප විශිෂ්ඨත්වය හඹා යාමේදී හමුවන අභියෝග අපගේ ප්‍රගමනය සඳහා අත්වැලක් කර ගැනීමට ඉඩ සලසයි.

එළඹෙන 2025/26 දෙස බැලීමේදී, කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම සිය වර්ධන ගමන් පථය එලෙසින්ම පවත්වා ගන්නා බවට මම විශ්වාස කරමි. අපගේ වෙළඳපල කොටස සහ සන්නාම කීර්තිය වැඩිදියුණු කිරීම සඳහා, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අපගේ ප්‍රවර්ධන සහ අලෙවි උපාය මාර්ග තවදුරටත් සංවර්ධනය කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු.

2025/26 වන විට ආදර්ශ සමාගමක් වීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමේදී ස්වයංක්‍රීයකරණය, ඩිජිටල් පරිණාමනය සහ උසස් තාක්ෂණය යොදා ගැනිම තීරණාත්මක වනු ඇත. මෙම ඩිජිටල් යුගයේදී, තරගකාරී වාසිය ලබා ගැනීම හා සාර්ථකත්වය ළඟා කර ගැනීම පිණිස ප්‍රතිව්‍යුහගත කිරීම, නව උපාය මාර්ග, අපගේ මානව ප්‍රාග්ධනයේ කුසලතා ඉහළ නැංවීම සහ සාධ්‍ය ආයතනික සංස්කෘතියක් පෝෂණය කිරීමෙ වෙනුවෙන් අපි ආයෝජනය කරන්නෙමු. තවද, අපගේ කුඩා තේ වතු හිමියන්ට සහාය වෙමින් සහ විවිධ ආයතනික සමාජ වගකීම් මුලපිරීම් හරහා ප්‍රජාවගේ සුභසාධනයට දායක වෙමින්, තිරසාර හා සදාචාරාත්මක ව්‍යාපාරික පිළිවෙත් සඳහා අපගේ කැපවීම අපි දිගටම පවත්වා ගන්නෙමු.

වර්ධනයේ හා සාර්ථකත්වයේ මෙම නව යුගය කරා කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව මෙහෙයවීමට මම ප්‍රබෝධවත් හැඟුමෙන් සිටින්නෙමි. අපගේ කැපවූ කණ්ඩායමේ අඛණ්ඩ සහයෝගය සහ අපගේ නව කළමනාකරණ කණ්ඩායම විසින් ගෙන එන ලද නැවුම් ඉදිරි දර්ශන සමඟ, අපි අතීත අභියෝග ජය ගන්නවා පමණක් නොව, ඉදිරි වසරවලදී ඊටත් වඩා ඉහළ මට්ටමකට නැඟී සිටිනු ඇතැයි මම විශ්වාස කරමි. කල් පවත්නා විශිෂ්ඨත්වයෙන් හා සමෘද්ධිත්භාවයෙන් යුතු අනාගතයක් සහතික කරමින් අපි අපගේ ශක්තිමත් පදනම මත එක්ව ගොඩ නගමින් සමාගම ඉදිරිය කරා රැගෙන යන්නෙමු. 2023/24 කාර්යසාධනයේ ශක්තිමත් පදනම මත ගොඩනැගෙමින්, අපගේ සාර්ථකත්වයේ මූලාශ්‍රය වන තේ දළු හා ඒවා වගා කරන ප්‍රජාවන් අන්තර්ගත කිරීම පිණිස අපගේ ඉලක්කය මූල්‍ය ජයග්‍රහණවලින් ඔබ්බට විහිදෙයි. අපගේ දළු සැපයුම්කරුවන්, ප්‍රධාන වශයෙන් අවට ගම්මානවල කුඩා වතු හිමියන්, විසින් ඉටු කරනු ලබන වැදගත් කාර්යභාරය හඳුනා ගනිමින්, ඉදිරි වසර සඳහා ප්‍රධාන ප්‍රමුඛතාවයක් වන්නේ ඔවුන් සමඟ අපගේ සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ සමාජ යහපැවැත්ම වැඩිදියුණු කිරීමයි.

ගුණාත්මකභාවය පිළිබඳ අපගේ කැපවීම ආරම්භ වන්නේ මූලාශ්‍රයෙනි. අපගේ දළු සැපයුම්කරුවන්ගේ කැපවීම හා අනලස්බව කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලාව නිපදවනු ලබන සුවිශේෂී තේවල අත්‍යවශ්‍ය අංගයක් බව අපි අවබෝධ කර ගන්නෙමු. එබැවින්, සාධාරණ සහ තිරසාර හවුල්කාරිත්වයක් සහතික කිරීම සඳහා අපි ක්‍රියාකාරීව උපාය මාර්ග ගවේෂණය කර ක්‍රියාත්මක කරමින් සිටිමු. සාධාරණ මිලකරණය සහ විනිවිද පෙනෙන ගනුදෙනු සහතික කිරීම පිණිස අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් පිළිබඳ පුළුල් සමාලෝචනයක් මෙයට ඇතුළත් වේ. හුදෙක්ම ගනුදෙනුකාර සබඳතා ඉක්මවා ගොස් අපගේ සැපයුම්කරුවන්ගේ වර්ධනය හා සමෘද්ධිත්භාවය අපගේ සාර්ථකත්වය හා නෛසර්ගිකව බැඳුණු සහයෝගිතා පරිසරයක් ප්‍රවර්ධනය කිරීම අපි අරමුණු කරන්නෙමු. ඒ සඳහා, දළු සැපයුම්කරුවන් හා සම්බන්ධ වී කටයුතු කිරිම ඉහළ නැංවීම අරමුණු කරගත් මූලාරම්භයන් කිහිපයක් ක්‍රියාවට නැංවීමට අප කැපව සිටින්නෙමු:

- අපගේ ගොවීන් සමඟ වඩාත් සෘජු සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීමට අපි සැලසුම් කරමු. මෙයට නිතිපතා රැස්වීම්, වැඩමුළු සහ අපගේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ස්ථානීය සංචාර පැවැත්වීමෙන් හොඳම කෘෂිකාර්මික පිළිවෙත්, තත්ත්ව පාලන පියවර සහ තිරසාර ගොවිතැන් ශිල්පීය ක්‍රම පිළිබඳ මග පෙන්වීමක් ලබා දෙනු ඇත. විවෘත සංවාදයක් ඇති කිරීමෙන්, අපට ඔවුන්ගේ අභියෝග වඩා හොඳින් තේරුම් ගත හැකි අතර විසඳුම් සෙවීම සඳහා සහයෝගයෙන් කටයුතු කළ හැකිය.
- දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම තුළින් අපගේ සැපයුම්කරුවන් සවිබල ගැන්වීම අපි විශ්වාස කරමු. නවීන කෘෂිකාර්මික ශිල්පීය ක්‍රම, පළිබෝධ සහ රෝග කළමනාකරණය, පාංශු සෞඛ්‍ය වැඩිදියුණු කිරීම සහ තිරසාර ගොවිතැන් පිළිවෙත් පිළිබඳ පුහුණු වැඩසටහන් අපි සංවිධානය කරන්නෙමු. මෙම මුලපිරීම් ඔවුන්ගේ තේ දළුවල ගුණාත්මකභාවය සහ අස්වැන්න වැඩි දියුණු කිරීම පමණක් නොව, ඔවුන්ගේ ජීවනෝපායන් සහ පරිසරයේ දිගුකාලීන තිරසාරභාවයට ද දායක වනු ඇත.
- අපගේ කැපවීම ගොවි බිමේදී ලබා දෙන මිලෙන් ඔබ්බට විහිද යයි. අපගේ සැපයුම්කරුවන්ගේ යහපැවැත්ම ඔවන්ගේ ප්‍රජාවන්ගේ සමස්ත සෞඛ්‍යය හා සෞභාග්‍යය හා දැඩිව බැඳී පවතින බව අපි පිළිගන්නෙමු. එබැවින්, අපගේ සමාජීය උපකාරක මුලපිරීම් අභිවර්ධනය පිණිස ඇති මාර්ග අපි සක්‍රියව ගවේෂණය කරමින් සිටින්නෙමු, ඊට පහත දෑ අයත් වනු ඇත:
  - ප්‍රවේශ මාර්ග, පිරිසිදු ජල පහසුකම් සහ සනීපාරක්ෂාව වැනි තේ වගා කරන ප්‍රජාවන් සඳහා වන අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනයට සහාය වීම.
  - ගොවීන් සහ ඔවුන්ගේ පවුල් සඳහා මූලික සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය පහසු කිරීම සහ සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.
  - ශිෂ්‍යත්ව මගින් හෝ ප්‍රදේශයේ පාසල් සඳහා ආධාර මගින් අපගේ කුඩා තේ වතු හිමියන්ගේ දරුවන්ට අධ්‍යාපන ආධාර ලබා දීම.
  - ප්‍රජාවන් තුළ ව්‍යවසායකත්වය, කුසලතා සංවර්ධනය සහ විකල්ප ආදායම් උත්පාදන අවස්ථා ප්‍රවර්ධනය කරන මුලපිරීම් සඳහා සහාය වීම.

අපගේ දළු සැපයුම්කරුවන් සමග සක්‍රියව සම්බන්ධ වී කටයුතු කිරීම හා ඔවුන්ගේ සමාජීය හා ආර්ථික යහපැවැත්මෙහි ආයෝජනය කිරීම මගින්, අන්‍යොන්‍යව වාසිදායක පරිසරයක් නිර්මාණය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු. සශ්‍රීක කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රජාවක් ඉහළ ගුණාත්මකබවින් යුතු තේ දළු සැපයුමක් සහතික කරනවා පමණක් නොව කලාපයේ සමාජ ව්‍යුහය ශක්තිමක් කර වගකීමෙන් කටයුතු කරන සදාචාරාත්මක ආයතනික පුරවැසියෙක් ලෙස අපගේ කීර්තිනාමය ඉහළ නංවනු ඇත.

මෙම මුලපිරීම් සඳහා අපගේ කැපවීම, තිරසාර වර්ධනය යනු මූල්‍යමය සාර්ථකත්වය පමණක් නොව, අප ක්‍රියාත්මක වන ප්‍රජාවන් තුළ ධනාත්මක බලපෑමක් ඇති කිරීම ද යන අපගේ විශ්වාසය අවධාරණය කරයි. ඉදිරි වසරේදී අපගේ දළු සැපයුම්කරුවන් සමඟ සමීපව කටයුතු කිරීමටත්, ශක්තිමත් සබඳතා ගොඩනගා ගැනීමටත්, ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීමටත්, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අඛණ්ඩ සාර්ථකත්වයට සාමූහිකව දායක වීමටත් අපි බලාපොරොත්තු වෙමු.

**ශමින්ද සමරසිංහ**
සභාපති

# අධ්‍යක්ෂ මණ්ඩලය

2024 මාර්තු 31 දිනට

**බී. කේ. ඒ. යූ. රුද්‍රිගු මයා – සභාපති – 2020 මැයි 01 දින සිට**

ඒ මහතා රොහාන් රුද්‍රිගු සමූහයේ සමූහ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි. මෙම පත්වීමට පෙර, රුද්‍රගු මහතා ශ්‍රී ලංකා තරුණ ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කරන ලදී. එසේම ඒ මහතා ඊට පෙරාතුව ඇ.එ.ජ. පදනම් කරගත් රාජ්‍ය නොවන සංවිධානයක මෙරට අධ්‍යක්ෂවරයා ලෙස සහ ඇ.එ.ජ. වොෂිංටන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දෙවන ලේකම්වරයා ලෙසක කටයුතු කර ඇත.

රුද්‍රිගු මහතා ලීඩ්ස් විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ගෞරව) උපාධිධරයෙකි.

**බී. ඒ. ටී. රොද්‍රිගෝ මහතා – සාමාජික – 2023 අගෝස්තු 17 දින සිට**

රොද්‍රිගෝ මහතා දශක තුනකට වැඩි පළපුරුද්දක් ඇති පළපුරුදු රාජ්‍ය මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු දැනට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරයි.

ඔහුගේ වෘත්තීය ජීවිතය විගණකාධිපති දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඇතුළු විවිධ භූමිකාවන් ආවරණය කරයි.

රොද්‍රිගෝ මහතා වාණිජවේදී උපාධියක් සහ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජිකයෙකු සහ වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරයෙකි.

ඔහු දැනට රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂ ධුර දරන අතර විගණන සහ කළමනාකරණ කමිටුවල සභාපති ලෙස සේවය කරයි.

**ඩී. එම්. එම්. දිසානායක මිය – සාමාජික – 2021 මාර්තු 31 දින සිට**

ඇය 2008 වසරේ සිට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරිණියක් ලෙස කටයුතු කරයි.

ඇය කිතුල් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර ඇති අතර වත්මනෙහි දිසානායක මහත්මිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි ලෙස කටයුතු කරයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) විශේෂ උපාධියක්, කැළණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති උපාධියක් හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිපලෝමාව ලබා ඇත.

**එස්.ඒ.බී. හේරත් මයා – සාමාජික – 2022 දෙසැම්බර් 02 දින සිට**

ඒ මහතාට විවිධ කර්මාන්තවල අත්දැකීම් ඇති අතර දක්ෂිණ සංවර්ධන අධිකාරියේ සභාපති, තරුණ සේවා සභාවේ සභාපති, නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගමේ අධ්‍යක්ෂ, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහ සමාගමේ අධ්‍යක්ෂ ඇතුළුව ආයතන 9 ක විවිධ තනතුරු දරන ලදී. දැනට ඔහු ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි.

හේරත් මහතා ඇබරිස්ට්විත්, වේල්ස් විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ආර්ථික විද්‍යා) ගෞරව උපාධිධරයෙකි.





**ආර්. සී. ඩී. ජයවර්ධන මයා – සාමාජික – 2021 ජනවාරි 22 දින සිට**

නීති වෘත්තිකයෙකු ලෙස ඔහුට වසර 19 කට වැඩි පළපුරුද්දක් ඇති අතර ප්‍රධාන පෙළේ බැංකු හා රක්ෂණ සමාගම් ඇතුළුව කෑගල්ල දිස්ත්‍රික්කයේ ආයතන 13 ක නීතිඥවරයකු ලෙස කටයුතු කර ඇත. කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමට පත් කිරීමට පෙර ඒ මහතා සබරගමුව පළාත් මගී ප්‍රවාහන අධිකාරියේ, සමුපකාර සේවක කොමිෂන් සභාවේ සහ සංවර්ධන හා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අධිකාරියේ සභාපති තනතුරු දැරීය.

**ආර්. එච්. එස්. ටී. සමරතුංග මහතා – සාමාජික – 2024 පෙබරවාරි 28 සිට**

සමරතුංග මහතා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය දරන, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ජාතික ආයතනයේ සේවය කරයි. ඔහුට ආගන්තුක සත්කාර, මෝටර් රථ සහ LPG කර්මාන්ත පිළිබඳ අත්දැකීම් තිබේ. ඔහු එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයෙන් අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇති අතර කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හදාරමින් සිටී. සමරතුංග මහතා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්ව මුලපිරීම් සඳහා රජයේ ව්‍යාපෘති කමිටුවලට සම්බන්ධ වී ඇති අතර වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකි.

**ඩබ්ලිව්. ජී. ආර්. ඩී. විමලරත්න මහතා – සාමාජික – 2023 පෙබරවාරි 25 සිට**

ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් පීඑල්සී හි කර්මාන්තශාලා කළමනාකරු ලෙස සේවය කර ඇති ඔහු ඉංජිනේරු සහ කළමනාකරණය පිළිබඳ පුළුල් අත්දැකීම් ඇති අයෙකි. ඔහු අයිසෙල් ට්‍රෙන්ඩ්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ද වේ.

විමලරත්න මහතා මොරටුව විශ්ව විද්‍යාලයෙන් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාවක් (NDT) ලබා ඇත.

**ඩී. එම්. එස්. ජයසේකර මහතා – සාමාජික – 2023 පෙබරවාරි 25 සිට**

ඩී. එම්. එස්. ජයසේකර මහතා අධ්‍යාපනය සහ රාජ්‍ය සේවයේ පුළුල් අත්දැකීම් ඇති අයෙකි.

කුරුණෑගල කාර්මික විද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාවක්, කැලණිය විශ්ව විද්‍යාලයෙන් ජනමාධ්‍ය සහ මහජන සම්බන්ධතා පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති ඔහු විවෘත විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ උපාධියක අවසන් වසරේ ඉගෙනුම ලබයි.

ජයසේකර මහතාට කෘෂිකර්ම අමාත්‍යාංශයේ (සබරගමුව පළාත්) කළමනාකරණ සහකාරවරයෙකු ලෙස වසර හතරක පළපුරුද්දක් ඇත. ගරු අමාත්‍ය එච්. ආර්. මිත්‍රපාල, ගරු අමාත්‍ය රංජිත් සියඹලාපිටිය සහ ගරු අමාත්‍ය රංජිත් සියඹලාපිටිය යන මහත්වරුන්ගේ පෞද්ගලික සහකාරවරයෙකු ලෙසද සේවය කර ඇති අතර, රාජ්‍ය පරිපාලනය සහ අමාත්‍යාංශ සහාය පිළිබඳ සැලකිය යුතු අත්දැකීම් ලබා ඇත.

# ආයතනික කළමනාකාරිත්වය



**ටී. ඒ. ඩී. ජේ. සී. තිලකරත්න මහතා**

මෙහෙයුම් ප්‍රධානී,
කළමනාකරු, කළුබෝවිටියන සීටීසී තේ කර්මාන්ත ශාලාව



**පී. දෙහිවලගේ මහතා**

මූල්‍ය කළමනාකරු (වැඩබලන)



**ගණිඳු පලිහේන මහතා**

සහකාර කළමනාකරු පරිපාලන



**සෙව්වන්දි වලාකුළුගේ මහත්මිය**

සහකාර කළමනාකාරිනී (අලෙවි)

# අපගේ නිෂ්පාදන

## වෙළඳ නාම සහ තේ වර්ග

පහසුවෙන් භාවිතයට ගත හැකි කුඩා පැකට්ටුවල ඇසුරූ තේ මගින් කාර්ය බහුල ලෝකයට සැබෑ තේ රස ලබා දීමට උපකාර වන පීඑෆ් 1 කළුබෝවිටියාන සමාගමේ සීටීසී තේවල උසස්ම ශ්‍රේණිය වන අතර සමාගම සීටීසී නිෂ්පාදනයේ දිවයිනේ ප්‍රමුඛයා වන අතර එය මෙරට පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වෙමින් පවතී.

දැරංගල සහ හිනිදුම තේ ඒවායේ විවිධ හැඩයෙන් යුතු තද පැහැති තේ පත්‍ර පෙනුම නිසා ප්‍රකටව ඇති අතර පැසීමට සැලස්වූ විටදී කදිම රත් පැහැයකට පත් වන අතර එහි සුවිශේෂී රසය අනෙකුත් කලාප හයෙහිම රසයට වඩා වෙනස් වේ.

මැණික්දිවෙල ලකුණ යටතේ සම්ප්‍රදායික පහත රට තේ නිපදවන අතර එම තේ එයටම ආවේණික සුවිශේෂී රසයකින් යුක්ත වේ.

## සීටීසී නිෂ්පාදන




## සම්ප්‍රදායික නිෂ්පාදන




## ප්‍රමිතිය

අපගේ තේ ඒවායේ විශිෂ්ඨ ගුණාත්මකබව නිසා කීර්තියට පත්ව ඇති අතර පිළිගත් තත්ත්ව සහතික, නිෂ්පාදන වගකීම පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා සහතික කරනු ලැබ තිබේ. සියලු නිපැයුම් හා ක්‍රියාදාම ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් නිකුත් කරන ලද ISO 22000:2018 සහ HACCP සමග පූර්ණව අනුකූල වන අතර ඊට අමතරව සියලුම කර්මාන්ත ශාලාවලට යහපත් නිෂ්පාදන පරිචය (GMP) පිළිබඳ සහතිකකරණය හිමිව තිබේ. සියලු කළුබෝවිටියාන තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා සඳහා ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (ISO 22000:2018 සහ HACCP) ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම, නිෂ්පාදන වගකීම කෙරෙහි අපගේ වගකීම ශක්තිමත් කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා තත්ත්ව ප්‍රමිති පවත්වා ගනු ලබන බව සහතික කරයි. බැර ලෝහ තිබේද යන්න සොයා බැලීම සඳහා තේවල ගුණාත්මකබව වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක නිර්ණායක සහ කෘෂි රසායනික අවසාදිත ISO 3720 ප්‍රමිතියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව වේ.


PREMIUM QUALITY
KALUBOWITIYANA
CEYLON
BLACK TEA
BP1 - Best CTC Tea
200g
PREMIUM QUALITY
DERANGALA
GINGER
TEA
PREMIUM QUALITY
DERANGALA
CINNAMON
TEA
DERANGALA
PURE
CEYLON
TEA
FBOPF1
BOPF
KALUBOWITIYANA
Strong
Tea
Black Pearl
CEYLON
BLACK
TEA
කළුබෝවිටියාන
ස්ට්‍රොං
PF1
OP

# සංවිධාන ව්‍යුහය


සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී
කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලනය)
කළමනාකරු (මූල්‍ය සහ අලෙවිකරණය)
පරිපාලන නිලධාරී
සහකාර කළමනාකරු (අලෙවිකරණය)
සහකාර කළමනාකරු මූල්‍ය
තොරතුරු තාක්ෂණ සහකාර
කළමනාකරණ සහකාර
අලෙවිකරණ නිලධාරී
රියදුරු
කාර්යාල කාර්ය සහායක
විකුණුම් සහකාර
ගිණුම්/ කළමනාකරණ සහකාර
කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික සහකාර
අභ්‍යන්තර විගණන නිලධාරී
විගණන සහකාර
රහස්‍ය ලේකම්
මෙහෙයුම් ප්‍රධානී
කර්මාන්තශාලා කළමනාකරුවන්
සහකාරකර්මාන්තශාලා කළමනාකරු
ව්‍යාප්ති නිලධාරී
කර්මාන්තශාලා නිලධාරීන්
ප්‍රධාන ලිපිකරුවන්
ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරීන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරුවන්
විදුලි කාර්මික/කාර්යාල නිලධාරීන්
සහකාර කර්මාන්ත ශාලා නිලධාරීන්
සහකාර ලිපිකරුවන්
ගබඩා භාරකරු
කණිෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරීන්
කනිෂ්ඨ ලිපිකරුවන්
මුරකරු
රියදුරන්
දෛනික වැටුප් ලබන සේවකයින්



# අපගේ ගමන් මග

**1994-95**
කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව නිෂ්පාදන මෙහෙයුම් ආරම්භ කරන ලදී

**1998/99**
ට්‍රාන්ස්වර්ල්ඩ් ස්ටාර් සම්මානය – ආර්ථික විද්‍යා අධ්‍යයන ආයතනය – ඉන්දියාව

**2000-01**
දැරංගල තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී.

**2010-11**
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – රුසියාව

**2009-10**
දෙවන ස්ථානය – වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව ගෝල්ඩන් කප් සම්මානය

**2013-14**
ජාතික වැවිලි කර්මාන්ත සම්මානය – හොඳම මහා පරිමාණ තේ කර්මාන්තශාලාව

**2012-13**
හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව මෙහෙයුම් ආරම්භ කරන ලදී

**2011-12**
සීටීසී පහතරට කාණ්ඩයේ සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව-ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

**2005-06**
සීටීසී පහතරට තේ කාණ්ඩයේ ඉහළම විකුණුම් සාමාන්‍යය – ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

**2006-07**
සීටීසී පහතරට කාණ්ඩයේ සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව-ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස්

**2014-15**
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – ඩුබායි – (රන් සම්මාන ජයග්‍රාහක හා රිදී සම්මාන ජයග්‍රාහක)

**2015-16**
සමාගමට අළුතින්ම එක්වූ මැණික්දිවෙල තේ කර්මාන්තශාලා සමාගම

**2016-17**
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – චීනය

**2017-18**
අපගේ නව තේ ඇසුරුම දියත් කරන ලදී

**2015-19**
මෙම වසරේ රේන්ෆොරස්ට් ඇලායන්ස් තිරසර සහතිකය හිමිකර ගන්නා ලදී

**2019-20**
අපගේ නව තේ ඇසුරුම සමග නව වෙබ්අඩවිය දියත් කරන ලදී

**2020-21**
නව ස්ථානයක අපගේ විකුණුම් අලෙවිහල විවෘත කරන ලදී

**2021-22**
වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ – රුසියාව

**2022-23**
මිලදී ගනු ලැබූ තේ සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළම මිල වූ රු. 437.82 ක් ගෙවන ලදී.
බදුවලින් පසු ඉහළම ලාබය – රු. මිලියන 220.80



## කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය

23 අපගේ පරිණාමනය
24 වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය
25 මූල්‍ය සමාලෝචනය
26 පාර්ශවකරුවන්ගේ සම්බන්ධතාවය
27 අවදානම් කළමනාකරණය
28 මෙහෙයුම් තොරතුරු
30 කර්මාන්තශාලා අනුව ලාභය/(අලාභය)
31 මාසික තේ නිෂ්පාදනය
32 වාර්ෂික තේ නිෂ්පාදනය
33 මාසික අමු දළු ලබා ගැනීම
34 වාර්ෂික අමු දළු ලබා ගැනීම
35 සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය
37 විකුණුම් සාමාන්‍යයන් උන්නතාංශය සමග සංසන්දනය කිරීම
39 සම්මාන සහ පිළිගැනීම
40 ඉහළම මිල ගණන් – 2023-24 වර්ෂය
42 ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්
43 අධ්‍යක්ෂවරයාගේ වාර්තාව
45 විගණන කමිටු වාර්තාව

# අපගේ පරිණාමනය

සමාගම් හතරම මෙහෙයුම් කටයුතු සිදුකළ පළමු මුදල් වර්ෂයේදී කර්මාන්තශාලා තුනක්, එනම් දැරංගල, හිනිදුම සහ මැණික්දිවෙල වාර්තා කළ මූල්‍ය අලාභය කළුබෝවිටියාන කර්මාන්ත ශාලව විසින් උපයනු ලැබූ ලාභයෙන් ආවරණය කළ බැවින්, මූල්‍ය කාර්යසාධනය අතිශයින්ම අවදානම් විය. 2015/16 දී කර්මාන්තශාලා තුනේ සමස්ත අලාභය රු. මිලියන 35.34 ක් වූ අතර කළුබෝවිටියාන කර්මාන්ත ශාලාවේ ලාභය මිලියන 42.46 ක් විය. උපාය මාර්ගික දිශානතිය, කර්මාන්ත ශාලා සංවර්ධනය, වෙළඳ පොළ විවිධාංගීකරණය සහ කොටස්කරුවන්, සේවකයන්, වගාකරුවන්, සැපයුම්කරුවන් සහ රටේ තේ අංශයට අගය නිර්මාණය කිරීම මගින් තිරසර මූලාරම්භය පිළිබඳ ගනු ලැබූ වැදගත් කළමනාකරණ තීරණ හේතුවෙන් 2022/23 මූල්‍ය වර්ෂය සුවිශේෂී සන්ධිස්ථානයක් විය.

වගුව – 04

| 2015-16 | කළමනාකරණ මැදිහත්වීම් | 2023-24 |
|---|---|---|
| රු. මිලියන 775.73 | ආදායම<br>• නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම | රු. මිලියන 1,802.1 |
| රු. මිලියන 9.81 | බදුවලින් පසු ලාභය<br>• පිරිවැය හා සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම | රු. මිලියන 55.57 |
| 8.62 කි.ග්‍රෑ මිලියන | වාර්ෂික අමු දළු ලබා ගැනීම<br>• එකට බැදුණු සැපයුම් දාමය | 6.33 කි.ග්‍රෑ මිලියන |
| 1.79 කි.ග්‍රෑ මිලියන | වාර්ෂික නිෂ්පාදනය<br>• තිරසර ප්‍රතිපත්ති<br>• නිෂ්පාදන ගුණාත්මක ප්‍රමිති | 1.30 කි.ග්‍රෑ මිලියන |
| රු. මිලියන 1.14 | සේවක පාරිතෝෂික හා සුබසාධනය<br>• පුහුණුව හා සංවර්ධනය<br>• සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තිය | රු. මිලියන 1.9 |



# අගය එකතු කිරීමේ ආකෘතිය

පහත දැක්වෙන රූපය සමාගමේ අගය එකතු කිරීමේ ආකෘතිය නිදර්ශනය කරන අතර වැදගත් සමාජ ආර්ථික සහ පාරිසරික බලපෑම්වලට අතිරේකව ඒකාබද්ධ වාර්තාකරණ රාමුව මගින් අර්ථ දක්වනු ලැබූ අත්‍යවශ්‍ය ප්‍රාග්ධන යෙදවුම් පාර්ශවකරුවන් සඳහා නිමවුම් හා ප්‍රතිඵල නිෂ්පාදන කිරීමට පරිවර්තනය කරන්නේ කෙසේදැයි එයින් පෙන්නුම් කරයි.








# මූල්‍ය සමාලෝචනය

## 1. ආදායම හා ලාභදායීතාවය අඩුවීම

මූල්‍ය ප්‍රකාශනවල වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වන්නේ 2023 රු. 2,635,413,672 ක් වූ ආදායම 2024 වසරේදී රු. 1,802,165,017.30 දක්වා විශාල ලෙස පහත වැටීමයි. මෙම 31.6% පහත වැටීම ලාභදායිතාවයට අඛණ්ඩ බලපෑමක් ඇති කර ඇති අතර, බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය 74.7% කින් පහත වැටී රුපියල් 55,574,507.21 ක් විය. මෙම පහත වැටීමට හේතු විය හැක්කේ විකුණුම් පරිමාව අඩු වීම, තේ මිල අඩු වීම හෝ අඩු වටිනාකමක් ඇති නිෂ්පාදන වෙත මාරුවීම ඇතුළු සාධක කිහිපයක් ය.

## 2. ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව

බැරකම්වල අඩුවීමක් සිදුවුව ද, සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය දුර්වල වී තිබේ. වඩාත්ම කනස්සල්ලට කරුණ වන්නේ සෘණ මුදල් සහ මුදල් සමාන දේවල ශේෂයයි. ජංගම බැරකම්වල සැලකිය යුතු අඩුවීමක් හේතුවෙන් ජංගම අනුපාතය 3.65 සිට 5.23 දක්වා වැඩිදියුණු වී ඇති අතර, සෘණ මුදල් ශේෂය සමාගමේ කෙටි කාලීන බැඳීම් සපුරාලීමේ හැකියාව පිළිබඳව බරපතල ගැටළු මතු කරයි. මෙම තත්ත්වය සඳහා ක්ෂණික විමර්ශනයක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් අවශ්‍ය කරයි.

## 3. මෙහෙයුම් කාර්යක්ෂතාව හා පිරිවැය කළමනාකරණය

පරිපාලන වියදම් අඩු කිරීමට සමාගම සමත් වී ඇතත්, ආදායමේ පහත වැටීමට සමානුපාතිකව විකුණුම් පිරිවැය අඩු වී නොමැත. මෙයින් ඇඟවෙන්නේ පිරිවැය කළමනාකරණයේ සහ නිෂ්පාදන ක්‍රියාවලීන්හි විභව්‍ය අකාර්යක්ෂමතාවන් ය. එපමණක් නොව, අඩු ආදායමක් තිබියදීත් විකුණුම් සහ බෙදා හැරීමේ වියදම් වැඩිවීම අලෙවිකරණ සහ බෙදා හැරීමේ උපාය මාර්ගවල ඵලදායීතාවය පිළිබඳ ප්‍රශ්න මතු කරයි. සමාගම එහි පිරිවැය ව්‍යුහය විවේචනාත්මකව ඇගයීමට සහ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට අවශ්‍ය වේ.

## 4. තොග කළමනාකරණය

තොගවල සැලකිය යුතු අඩුවීමක් ආකාර කිහිපයකින් අර්ථකථනය කළ හැකිය. එය කාර්යක්ෂම තොග කළමනාකරණයක් පෙන්නුම් කළ හැකි නමුත්, නිෂ්පාදනය අඩුවීම හෝ විකුණුම් අඩුවීම ද පෙන්නුම් කළ හැකිය. මෙම වෙනසට මූලික හේතු සහ සමාගමේ මෙහෙයුම් සඳහා එහි ඇඟවුම් තීරණය කිරීම සඳහා තවදුරටත් විමර්ශනය අවශ්‍ය වේ.

## 5. අයෝජන උපායමාර්ගය

කෙටි කාලීන ආයෝජනවල සැලකියයුතු වැඩිවීම හඟවනුයේ සමාගම අතිරික්ත මුදල් ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කිරීම තෝරා ගෙන ඇති බවයි. මූල්‍ය ආදායමේ වැඩිවීමෙන් පෙන්නුම් කරන පරිදි, මෙම උපාය මාර්ගය මඟින් මූල්‍ය ආදායමක් ජනනය කළ හැකි වුවද, මෙම මුදල් සෘණ මුදල් ශේෂය පියවා ගැනීමට හෝ දිගුකාලීන වර්ධන අවස්ථා සඳහා ආයෝජනය කිරීමට භාවිතා නොකරන්නේ මන්දැයි යන ප්‍රශ්න ද මතු කරයි.



# පාර්ශවකාර සබඳතාව

අප පාර්ශවකරුවන්ගේ ගැටලු හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම කෙතරම් තීරණාත්මක ද යන්න පිළිබඳව කළුබෝවිටියාන සමාගම දැනුවත්ව සිටී. අපගේ තීරණ මගින් එක් එක් කණ්ඩායමට බලපෑම් ඇති වන්නේ කෙසේද හෝ බලපෑනු ලැබිය හැක්කේ කෙසේද යන්න මත පරායත්ත වෙමින් ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනාගනු ලැබ ප්‍රමුඛතා ශ්‍රේණිගත කිරීමක් ලබා දෙනු ලැබේ. රජයට අයත් ව්‍යාපාරයක් ලෙස රජය හා ප්‍රජාවන් කෙරෙහි අපගේ දැවැන්ත වගකීමක් තිබේ. තෝරා ගැනීමේ සමාගමේ ක්‍රමවේදයට පාර්ශවකරුවන් සම්බන්ධ කර ගන්නා අතර පහත දැක්වෙන් ප්‍රමුඛතා ලැයිස්තුව ඊට අයත් වේ.

වගුව – 05

| පාර්ශවකාර කණ්ඩායම | උපායමාර්ගික සැලැස්ම | අපගේ ප්‍රතිචාරය |
|---|---|---|
| කොටස් හිමියන් | • කාර්තුමය හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන<br>• වාර්ෂික වාර්තාව<br>• වාර්ෂික මහා සභා රැස්වීම<br>• කොටසක් සඳහා ඉපැයුම්<br>• වර්ධනය හා ස්ථාවරත්වය | • වර්තමාන සංවර්ධන තත්ත්වය සමග දිගටම පවත්නා සන්නිවේදනය |
| සේවකයන් | • රැකියා විස්තර, ඉලක්ක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක<br>• චක්‍රලේඛ උපදෙස් හා සමාලෝචන රැස්වීම්.<br>• කාර්යසාධන ඇගයීම්.<br>• සුබසාධන කළමනාකරණය<br>• වාර්ෂික පාරිතෝෂික | • ප්‍රතිදාන සහ සංසක්ත කළමනාකරණය.<br>• පුහුණුව හා සංවර්ධනය<br>• වෘත්තීය සංවර්ධනය |
| සැපයුම්කරුවන් | • දැනුවත් කිරීමේ වැඩසටහන්<br>• පොහොර සැපයීම<br>• ආහාර ද්‍රව්‍ය සැපයීම<br>• ණය යෝජනා ක්‍රම<br>• ආකර්ෂණීය මිල<br>• නියමිත වේලාවට ලබා දීම | • නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම<br>• සැපයුම්කරුවන් රැකවරණය |
| වගාකරුවන් | • ගුණාත්මක දළු 50% හෝ ඊට වැඩි<br>• නියමිත වේලාවට ලබා දීම<br>• තේ මණ්ඩල අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීම<br>• දළු සඳහා ආකර්ෂණීය මිල<br>• සුබසාධන පහසුකම් | • නියමිත වේලාවට ගෙවීම් සිදු කිරීම<br>• අගය කිරීම හා දිරි දීමනා |
| ප්‍රවාහකයන් | • තේ මණ්ඩලයේ රෙගුලාසි අනුව කටයුතු කිරීම<br>• ගිවිසුමට අනුව කටයුතු කිරීම<br>• සුබසාධන යෝජනා ක්‍රමය | • නිසි වේලාවට ගෙවීම් සිදු කිරීම.<br>• දිරි දීමනා කළමනාකරණය |
| තැරැව්කරුවන් | • තේ මණ්ඩලයේ රෙගුලාසිවලට අනුව කටයුතු කිරීම<br>• මිල ගණන මත පාදක ප්‍රමාණය | • අඛණ්ඩ සැපයුම<br>• පිළිගැනීම |





# අවදානම් කළමනාකරණය




මුළුමණින්ම රජයට අයත් සමාගමක් ලෙස, සිය අරමුණ හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය කරා ගමන් කිරීමේදී, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයකට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම නිසි අවධානය යොමු කර තිබේ. අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීමේ අවසන් වගකීම දරනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි. අවදානම් සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට නොහැකි අවස්ථාවන්හිදී ඒවායේ බලපෑම අවම කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව සහතික කිරීම පිණිස උපාය මාර්ගික හා මෙහෙයුම් යන දෙයාකාර අවදානම් කාණ්ඩ යටතේ අවදානම් කළමනාකරණය නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. ව්‍යාපාරයේ හිමිකාරිත්වය කවරක් වුවද, අවදානමේ ස්වභාවය සහ ප්‍රමාණය කළමනාකරණය නොවැළැක්විය හැකිය. එවැනි අවදානම් සාධක ක්‍රමික හෝ අක්‍රමික විය හැකිය. ක්‍රමික අවදානම් විවිධාංගීකරණය කිරීම හෝ වැළක්වීම කළ නොහැකිය. අනෙක් අතට, අක්‍රමික අවදානම්, ඒ ඒ ව්‍යාපාරයේ මෙහෙයුමට අනන්‍ය බැවින් නිසි අවදානම් කළමනාකරණය මගින් අවම කිරීම හෝ මග හැරීම කළ හැකිය.

# මෙහෙයුම් තොරතුරු

## ප්‍රධාන කාර්යාලය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ලිපිනය | අංක 53, රත්නායක මාවත, පැලවත්ත, තලංගම දකුණ, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | | | | | |
| මානව සම්පත් | කළමනාකාර අධ්‍යක්ෂ | – | 1 | අභ්‍යන්තර විගණන නිලධාරි | – | 1 |
| | කළමනාකරු/පරිපාලන හා මානව සම්පත් | – | 1 | ගිණුම් සහායක | – | 2 |
| | කළමනාකරු මූල්‍ය | – | 1 | කළමනාකරණ සහායක | – | 5 |
| | සහාය කළමනාකරු මූල්‍ය | – | 1 | කාර්යාල කාර්ය සහායක | – | 2 |
| | සහාය කළමනාකරු අලෙවිකරණ | – | 1 | රියදුරු | – | 2 |



## කළුබෝවිටියාන සීටීසී කර්මාන්තශාලාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මාතර | | | උප දිස්ත්‍රික්කය | | මොරවක |
| ගම | කළුබෝවිටියාන | | | උන්නතාංශය | | පහත රට |
| වෙළඳ ලකුණ | කළුබෝවිටියාන | | | නිෂ්පාදන වර්ගය | | සම්ප්‍රදායික තේ වර්ග |
| මානව සම්පත් | කර්මාන්ත ශාලා කළමනාකරු | – | 1 | කර්මාන්ත ශාලා කාර්ය මණ්ඩලය | – | 15 |
| | කාර්යාල කාර්ය මණ්ඩලය | – | 6 | | | |



## දැරංගල තේ කර්මාන්තශාලාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මාතර | | | උප දිස්ත්‍රික්කය | | මොරවක |
| ගම | කිරිවැල්කැලේ | | | උන්නතාංශය | | පහත රට |
| වෙළඳ ලකුණ | දැරංගල/කිරිවැල්කැලේ | | | නිෂ්පාදන වර්ගය | | සම්ප්‍රදායික තේ වර්ග |
| මානව සම්පත් | කර්මාන්ත ශාලා කළමනාකරු | – | 1 | කර්මාන්ත ශාලා කාර්ය මණ්ඩලය | – | 10 |
| | කාර්යාල කාර්ය මණ්ඩලය | – | 4 | | | |



## හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ගාල්ල | | | උප දිස්ත්‍රික්කය | | තවලම |
| ගම | ජෙස්මින් වැලි | | | උන්නතාංශය | | පහත රට |
| වෙළඳ ලකුණ | හිනිදුම හිල්ස්/තවලම හිල්ස් | | | නිෂ්පාදන වර්ගය | | සම්ප්‍රදායික තේ |
| මානව සම්පත් | කර්මාන්ත ශාලා කළමනාකරු | – | 1 | කර්මාන්ත ශාලා කාර්ය මණ්ඩලය | – | 13 |
| | කාර්යාල කාර්ය මණ්ඩලය | – | 4 | | | |



## මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මහනුවර | | | උප දිස්ත්‍රික්කය | | යටිනුවර |
| ගම | මැණික්දිවෙල | | | උන්නතාංශය | | බස්නාහිර මධ්‍යම |
| වෙළඳ ලකුණ | මැණික්දිවෙල | | | නිෂ්පාදන වර්ගය | | බස්නාහිර මධ්‍යම |
| මානව සම්පත් | කර්මාන්ත ශාලා කළමනාකරු | – | 1 | කර්මාන්ත ශාලා කාර්ය මණ්ඩලය | – | 8 |
| | කාර්යාල කාර්ය මණ්ඩලය | – | 5 | | | |



# කර්මාන්ත ශාලා අනුව ලාභ/(අලාභය)

## විකුණුම්

වගුව – 06

| මාර්තු 31 දිනට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම | කළුබෝවිටියාන කර්මාන්තශාලාව රු. | දැරංගල කර්මාන්තශාලාව රු. | හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව රු. | මැණික්දිවෙල කර්මාන්තශාලාව රු. | අලෙවි මධ්‍යස්ථානය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| දළ විකුණුම් | 1,234,264,276.28 | 271,881,329.20 | 152,309,252.52 | 113,547,500.00 | - | 1,772,002,358.00 |
| අඩු කළා: තැරැව්කාර ගාස්තු හා විකුණුම් වියදම් | (15,227,157.57) | (3,874,547.80) | (2,201,639.36) | (1,850,452.54) | - | (23,153,797.27) |
| | **1,219,037,118.71** | **268,006,781.40** | **150,107,613.16** | **111,697,047.46** | **-** | **1,748,848,560.73** |
| එකතු කළා/අඩු කළා - අන්තර් කර්මාන්ත ශාලා ගනුදෙනු | | | | | | |
| එකතු කළා: දේශීය වියදම් | 23,270,749.79 | 7,309,512.74 | 642,082.18 | 3,938,563.41 | 18,155,548.45 | 53,316,456.57 |
| **එකතුව** | **1,242,307,868.50** | **275,316,294.14** | **150,749,695.34** | **115,635,610.87** | **18,155,548.45** | **1,802,165,017.30** |

## විකිණුම් පිරිවැය

වගුව – 07

| මාර්තු 31 දිනට කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම | කළුබෝවිටියාන කර්මාන්තශාලාව රු. | දැරංගල කර්මාන්තශාලාව රු. | හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව රු. | මැණික්දිවෙල කර්මාන්තශාලාව රු. | අලෙවි මධ්‍යස්ථානය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| මිලදී ගත් දළු | 845,295,247.22 | 232,967,648.25 | 111,430,353.68 | 100,943,864.93 | - | 1,290,637,114.08 |
| **නිෂ්පාදන පිරිවැය** | | | | | | |
| නිෂ්පාදන පිරිවැය | 143,468,426.17 | 54,477,682.18 | 33,069,809.78 | 32,740,915.92 | 20,097,865.00 | 283,854,699.05 |
| සාමාන්‍ය ගාස්තු | 49,676,070.02 | 31,593,130.30 | 21,595,347.26 | 16,273,644.96 | - | 119,138,192.54 |
| | **1,038,439,743.41** | **319,038,460.73** | **166,095,510.72** | **149,958,425.81** | **20,097,865.00** | **1,693,630,005.67** |
| එකතු කරන්න: ආරම්භක තොගය | 139,008,586.57 | 50,844,175.72 | 38,636,411.41 | 22,692,403.09 | 894,153.64 | 252,075,730.43 |
| අඩු: අවසාන තොගය | (81,191,587.93) | (70,408,656.36) | (23,086,556.02) | (21,794,359.51) | (1,563,488.18) | (198,044,648.00) |
| **එකතුව** | **1,096,256,742.05** | **299,473,980.09** | **181,645,366.11** | **150,856,469.39** | **19,428,530.46** | **1,747,661,088.10** |
| ලාභය/(අලාභය) | 146,051,126.45 | (24,157,685.95) | (30,895,670.77) | (35,220,858.52) | (1,272,982.01) | 54,503,929.21 |

# මාසික තේ නිෂ්පාදනය

වගුව – 08

| මාසය | කළුබෝවිටියාන කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | දැරංගල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | මැණික්දිවෙල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | එකතුව (කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|
| අප්‍රේල් 2023 | 67,347 | 19,179 | 13,178.8 | 16,133 | 115,838 |
| මැයි | 71,287 | 22,164 | 14,717.2 | 15,572 | 123,740 |
| ජූනි | 66,761 | 22,467 | 12,514.5 | 12,167 | 113,910 |
| ජූලි | 67,858.3 | 23,368 | 11,148.5 | 5,951 | 108,326 |
| අගෝස්තු | 67,059 | 16,689 | 8,792.0 | 3,655 | 96,195 |
| සැප්තැම්බර් | 74,882.2 | 15,740 | 11,378.0 | 10,674 | 112,674 |
| ඔක්තෝබර් | 89,082 | 19,496 | 8,534.0 | 19,457 | 136,569 |
| නොවැම්බර් | 86,622.5 | 7,045 | 2,279.5 | 15,202 | 111,149 |
| දෙසැම්බර් | 83,432.6 | 4,526 | 5,062.0 | 9,425 | 102,446 |
| ජනවාරි 2024 | 73,467 | 21,771 | 8,672.8 | 4,071 | 107,982 |
| පෙබරවාරි | 58,533.5 | 19,282 | 7,201.5 | 5,457 | 90,474 |
| මාර්තු | 52,549 | 16,598 | 6,507.0 | 6,781 | 82,435 |
| **එකතුව** | **858,881** | **208,325** | **109,986** | **124,545** | **1,301,737** |

ප්‍රස්තාරය – 08

කළුබෝවිටියාන කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 09

දැරංගල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 10

හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 11

මැණික්දිවෙල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)



# වාර්ෂික තේ නිෂ්පාදනය

වගුව – 09

| වසර | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | දැරංගල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | එකතුව (කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|---|
| 1994-95 | 536,780 | - | - | - | 536,780 |
| 1995-96 | 1,038,739 | - | - | - | 1,038,739 |
| 1996-97 | 1,082,973 | - | - | - | 1,082,973 |
| 1997-98 | 1,194,418 | - | - | - | 1,194,418 |
| 1998-99 | 809,741 | - | - | - | 809,741 |
| 1999-00 | 884,197 | 14,584 | - | - | 898,781 |
| 2000-01 | 914,433 | 494,894 | - | - | 1,409,327 |
| 2001-02 | 954,905 | 536,601 | - | - | 1,491,506 |
| 2002-03 | 1,039,447 | 636,762 | - | - | 1,676,209 |
| 2003-04 | 1,154,969 | 488,915 | - | - | 1,643,884 |
| 2004-05 | 1,173,659 | 361,154 | - | - | 1,534,813 |
| 2005-06 | 1,161,031 | 348,651 | - | - | 1,509,682 |
| 2006-07 | 1,272,903 | 278,828 | - | - | 1,551,731 |
| 2007-08 | 1,097,681 | 320,512 | - | - | 1,418,193 |
| 2008-09 | 967,631 | 227,617 | - | - | 1,195,248 |
| 2009-10 | 950,347 | 222,824 | - | - | 1,173,171 |
| 2010-11 | 994,746 | 269,314 | - | - | 1,264,060 |
| 2011-12 | 1,170,972 | 240,901 | - | - | 1,411,873 |
| 2012-13 | 1,110,907 | 254,706 | 168,425 | - | 1,534,038 |
| 2013-14 | 995,844 | 281,666 | 146,031 | - | 1,423,541 |
| 2014-15 | 943,706 | 315,854 | 171,751 | - | 1,431,311 |
| 2015-16 | 994,541 | 460,860 | 219,765 | 117,017 | 1,792,183 |
| 2016-17 | 811,708 | 429,382 | 253,157 | 209,464 | 1,703,711 |
| 2017-18 | 731,750 | 289,634 | 242,955 | 210,107 | 1,474,446 |
| 2018-19 | 807,843 | 276,186 | 174,272 | 202,120 | 1,460,421 |
| 2019-20 | 900,125 | 290,262 | 138,805 | 125,078 | 1,454,270 |
| 2020-21 | 916,577 | 314,349 | 320,290 | 163,508 | 1,714,724 |
| 2021-22 | 815,525 | 290,193 | 209,053 | 193,272 | 1,508,043 |
| 2022-23 | 1,004,572 | 234,603 | 148,406 | 161,034 | 1,548,615 |
| 2023-24 | 858,881 | 208,325 | 109,986 | 124,545 | 1,301,737 |
| **Total** | **29,291,551** | **8,087,577** | **2,302,895** | **1,506,145** | **41,188,168** |

ප්‍රස්තාරය – 12

සමාගමේ වාර්ෂික නිෂ්පාදනය (කි.ග්‍රෑ.)








# මාසික අමු දළු ලබා ගැනීම්

වගුව – 10

| මාසය | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | | දැරංගල තේ කර්මාන්තශාලාව | | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව | | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද දළු ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
| අප්‍රේල් 2023 | 2,412 | 318,178 | 672 | 92,162 | 74 | 62,706 | 125 | 74,767 | 3,283 | 547,813 |
| මැයි | 2,371 | 336,385 | 661 | 105,531 | 76 | 72,887 | 118 | 73,736 | 3,226 | 588,539 |
| ජූනි | 2,363 | 315,798 | 656 | 109,535 | 69 | 59,536 | 117 | 56,786 | 3,205 | 541,655 |
| ජූලි | 2,340 | 315,001 | 651 | 111,280 | 70 | 55,342 | 114 | 29,747 | 3,175 | 511,370 |
| අගෝස්තු | 2,357 | 304,245 | 637 | 78,352 | 61 | 41,229 | 111 | 17,043 | 3,166 | 440,869 |
| සැප්තැම්බර් | 2,369 | 358,905 | 637 | 80,785 | 55 | 55,229 | 97 | 51,813 | 3,158 | 546,732 |
| ඔක්තෝබර් | 2,379 | 425,216 | 632 | 102,444 | 47 | 41,568 | 103 | 100,579 | 3,161 | 669,807 |
| නොවැම්බර් | 2,331 | 414,006 | 612 | 78,479 | 43 | 11,323 | 97 | 75,403 | 3,083 | 579,211 |
| දෙසැම්බර් | 2,337 | 401,646 | 597 | 63,445 | 52 | 24,524 | 95 | 52,090 | 3,081 | 541,705 |
| ජනවාරි 2024 | 2,358 | 350,414 | 594 | 116,745 | 57 | 43,123 | 95 | 19,827 | 3,104 | 530,109 |
| පෙබරවාරි | 2,355 | 265,738 | 560 | 100,951 | 46 | 35,192 | 95 | 26,360 | 3,056 | 428,241 |
| මාර්තු | 2,375 | 235,941 | 559 | 86,119 | 43 | 31,018 | 91 | 53,547 | 3,068 | 406,625 |
| **එකතුව** | | **4,041,473** | | **1,125,828** | | **533,677** | | **631,698** | | **6,332,676** |

ප්‍රස්තාරය – 13

කළුබෝවිටියාන කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 14

දැරංගල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 15

හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)




ප්‍රස්තාරය – 16

මැණික්දිවෙල කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.)



# වාර්ෂික අමු දළු පරිභෝජනය

වගුව – 11

| වසර | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | දැරංගල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|
| 1994/95 | 2,539,978 | - | - | - |
| 1995/96 | 4,758,850 | - | - | - |
| 1996/97 | 5,011,298 | - | - | - |
| 1997/98 | 5,619,161 | - | - | - |
| 1998/99 | 3,764,498 | - | - | - |
| 1999/00 | 4,092,958 | 68,377 | - | - |
| 2000/01 | 4,225,019 | 2,283,999 | - | - |
| 2001/02 | 4,406,549 | 2,452,187 | - | - |
| 2002/03 | 4,779,581 | 3,042,878 | - | - |
| 2003/04 | 5,316,428 | 2,274,012 | - | - |
| 2004/05 | 5,464,753 | 1,727,312 | - | - |
| 2005/06 | 5,362,732 | 1,688,298 | - | - |
| 2006/07 | 5,859,734 | 1,339,562 | - | - |
| 2007/08 | 5,061,084 | 1,559,138 | - | - |
| 2008/09 | 4,455,756 | 1,129,629 | - | - |
| 2009/10 | 4,406,749 | 1,114,004 | - | - |
| 2010/11 | 4,634,137 | 1,359,341 | - | - |
| 2011/12 | 5,421,437 | 1,136,937 | - | - |
| 2012/13 | 5,161,301 | 1,243,421 | 838,887 | - |
| 2013/14 | 4,638,578 | 1,386,298 | 731,251 | - |
| 2014/15 | 4,446,200 | 1,539,561 | 834,380 | - |
| 2015/16 | 4,774,872 | 2,249,785 | 1,095,511 | 542,106 |
| 2016/17 | 3,941,813 | 2,113,499 | 1,235,080 | 1,033,573 |
| 2017/18 | 3,499,414 | 1,474,475 | 1,224,781 | 1,097,625 |
| 2018/19 | 3,855,520 | 1,342,705 | 875,077 | 1,023,085 |
| 2019/20 | 4,237,689 | 1,399,915 | 683,988 | 625,482 |
| 2020/21 | 4,375,283 | 1,517,906 | 1,577,904 | 800,398 |
| 2021/22 | 3,864,328 | 1,415,917 | 1,065,152 | 901,435 |
| 2022/23 | 4,738,165 | 1,140,314 | 721,877 | 746,857 |
| 2023/24 | 4,041,473 | 1,125,828 | 533,677 | 631,698 |

# සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය

## පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය

වගුව – 12

| මාසය | සී.ටී.සී. | | නිෂ්පාදනය කළුබෝවිටියාන* (කි.ග්‍රෑ.'000) | නිෂ්පාදනය වෙත දායකත්වය | |
|---|---|---|---|---|---|
| | පහතරට (කි.ග්‍රෑ.'000) | ජාතික (කි.ග්‍රෑ.'000) | | පහතරට (%) | ජාතික (%) |
| අප්‍රේල් 2023 | 14,290,453 | 25,237,807 | 58,269.50 | 0.41 | 0.23 |
| මැයි | 14,760,035 | 26,825,090 | 92,874.90 | 0.63 | 0.35 |
| ජූනි | 13,403,471 | 23,088,476 | 74,246.00 | 0.55 | 0.32 |
| ජූලි | 13,733,747 | 21,567,438 | 78,626.00 | 0.57 | 0.36 |
| අගෝස්තු | 11,152,655 | 18,358,092 | 78,762.00 | 0.71 | 0.43 |
| සැප්තැම්බර් | 11,567,172 | 18,903,445 | 58,429.00 | 0.51 | 0.31 |
| ඔක්තෝබර් | 14,829,023 | 23,000,259 | 87,977.00 | 0.59 | 0.38 |
| නොවැම්බර් | 11,704,128 | 19,784,674 | 81,234.00 | 0.69 | 0.41 |
| දෙසැම්බර් | 12,257,920 | 19,808,997 | 50,825.50 | 0.41 | 0.26 |
| ජනවාරි 2024 | 12,566,699 | 18,729,459 | 88,097.50 | 0.70 | 0.47 |
| පෙබරවාරි | 11,826,047 | 19,996,014 | 67,773.00 | 0.57 | 0.34 |
| මාර්තු | 11,826,047 | 19,996,014 | 64,269.50 | 0.54 | 0.32 |
| **එකතුව** | **153,917,397** | **255,295,765** | **881,383.90** | **0.57** | **0.35** |

* කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

## පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය

වගුව – 13

| මාසය | සම්ප්‍රදායික නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | නිෂ්පාදනය වෙත දායකත්වය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පහතරට (කි.ග්‍රෑ.'000) | මධ්‍යම (කි.ග්‍රෑ.'000) | ජාතික (කි.ග්‍රෑ.'000) | දැ.තේ.ක*/ හි.හි.ක** (කි.ග්‍රෑ.'000) | මැ.තේ.ක*** (කි.ග්‍රෑ.'000) | පහතරට (කි.ග්‍රෑ.'000) | මධ්‍යම (කි.ග්‍රෑ.'000) | ජාතික (කි.ග්‍රෑ.'000) |
| අප්‍රේල් 2023 | 13,207,255 | 3,571,683 | 22,197,966 | 21,185 | 15,517 | 0.16 | 0.43 | 0.16 |
| මැයි | 13,730,752 | 3,721,782 | 23,732,689 | 37,386 | 12,017 | 0.27 | 0.32 | 0.20 |
| ජූනි | 12,496,555 | 3,211,796 | 20,755,797 | 34,306 | 16,561 | 0.27 | 0.51 | 0.24 |
| ජූලි | 12,861,871 | 2,753,202 | 19,471,738 | 29,161 | 9,029 | 0.22 | 0.32 | 0.19 |
| අගෝස්තු | 10,332,067 | 2,450,310 | 16,432,864 | 39,832 | 10,355 | 0.38 | 0.42 | 0.30 |
| සැප්තැම්බර් | 10,578,350 | 2,529,329 | 16,894,196 | 22,289 | 2,318 | 0.21 | 0.09 | 0.14 |
| ඔක්තෝබර් | 13,873,338 | 3,284,932 | 20,787,810 | 28,715 | 8,406 | 0.26 | 0.25 | 0.17 |
| නොවැම්බර් | 10,877,816 | 2,809,018 | 17,673,329 | 29,583 | 9,003 | 0.27 | 0.32 | 0.21 |
| දෙසැම්බර් | 11,403,940 | 2,384,438 | 17,790,508 | 19,610 | 10,004 | 0.17 | 0.41 | 0.16 |
| ජනවාරි 2024 | 11,666,144 | 2,052,868 | 16,869,288 | 12,877 | 13,970 | 0.11 | 0.68 | 0.15 |
| පෙබරවාරි | 11,012,669 | 3,009,117 | 18,024,710 | 26,391 | 10,615 | 0.23 | 0.35 | 0.20 |
| මාර්තු | 9,953,218 | 3,216,158 | 17,495,739 | 24,830 | 8,885 | 0.24 | 0.27 | 0.19 |
| **එකතුව** | **141,993,975** | **34,994,633** | **228,126,634** | **326,162** | **126,677** | | | |

* දැරංගල තේ කර්මාන්තශාලාව ** හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව *** මැණික්දිවෙලතේ කර්මාන්තශාලාව

සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය

## පහතරට තේ නිෂ්පාදනය සහ ජාතික තේ නිෂ්පාදනය සඳහා සමාගමේ දායකත්වය

වගුව – 14

| මාසය | මුළු නිෂ්පාදනය | | | සමාගමේ මුළු නිෂ්පාදනය (කි.ග්‍රෑ. '000) | නිෂ්පාදනය සඳහා දායකත්වය | | |
|---|---|---|---|---|---|---|---|
| | පහතරට (කි.ග්‍රෑ. '000) | මධ්‍යම (කි.ග්‍රෑ. '000) | ජාතික (කි.ග්‍රෑ. '000) | | පහතරට (කි.ග්‍රෑ. '000) | මධ්‍යම (කි.ග්‍රෑ. '000) | ජාතික (කි.ග්‍රෑ. '000) |
| අප්‍රේල් 2023 | 14,290,453 | - | 25,237,807 | 74,421.7 | 0.52 | | 0.29 |
| මැයි | 14,760,035 | - | 26,825,090 | 108,469.1 | 0.73 | | 0.40 |
| ජූනි | 13,403,471 | - | 23,088,476 | 86,435.5 | 0.64 | | 0.37 |
| ජූලි | 13,733,747 | - | 21,567,438 | 84,600.4 | 0.62 | | 0.39 |
| අගෝස්තු | 11,152,655 | - | 18,358,092 | 82,433.7 | 0.74 | | 0.45 |
| සැප්තැම්බර් | 11,567,172 | - | 18,903,445 | 69,118.7 | 0.60 | | 0.37 |
| ඔක්තෝබර් | 14,829,023 | - | 23,000,259 | 107,453.5 | 0.72 | | 0.47 |
| නොවැම්බර් | 11,704,128 | - | 19,784,674 | 96,443.0 | 0.82 | | 0.49 |
| දෙසැම්බර් | 12,257,920 | - | 19,808,997 | 60,255.0 | 0.49 | | 0.30 |
| ජනවාරි 2024 | 12,566,699 | - | 18,729,459 | 92,190.3 | 0.73 | | 0.49 |
| පෙබරවාරි | 11,826,047 | - | 19,996,014 | 73,249.3 | 0.62 | | 0.37 |
| මාර්තු | 11,826,047 | - | 19,996,014 | 71,067.1 | 0.60 | | 0.36 |
| **එකතුව** | **153,917,397** | **-** | **255,295,765** | **1,006,137.2** | **0.65** | | **0.39** |

# විකුණුම් සාමාන්‍යය උන්නතාංශය සමග සැසඳීම

## පහතරට උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳීම

වගුව – 15

| මාසය | පහතරට සාමාන්‍යය (රු.) | මාසික සාමාන්‍යය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | කළුබෝවිටියාන කර්මාන්තශාලාව (රු.) | විචලනය | දැරංගල කර්මාන්තශාලාව (රු.) | විචලනය | හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (රු.) | විචලනය |
| අප්‍රේල් 2023 | 1,299.43 | 1,359.82 | 60.39 | 1,585.76 | 286.33 | 1,317.92 | 18.49 |
| මැයි | 1,120.52 | 1,211.58 | 91.06 | 1,607.90 | 487.38 | 1,575.37 | 454.85 |
| ජූනි | 1,067.85 | 1,171.44 | 103.59 | 1,545.40 | 477.55 | 1,609.10 | 541.25 |
| ජූලි | 1,108.03 | 1,280.19 | 172.16 | 1,659.11 | 551.08 | 1,669.00 | 560.97 |
| අගෝස්තු | 1,211.48 | 1,589.52 | 378.04 | 1,641.52 | 430.04 | 1,611.26 | 399.78 |
| සැප්තැම්බර් | 1,249.15 | 1,728.93 | 479.78 | 1,837.79 | 588.64 | 1,791.93 | 542.78 |
| ඔක්තෝබර් | 1,219.10 | 1,517.60 | 298.50 | 1,707.44 | 488.34 | 1,628.33 | 409.23 |
| නොවැම්බර් | 1,190.90 | 1,510.77 | 319.87 | 1,575.55 | 384.65 | 1,557.59 | 366.69 |
| දෙසැම්බර් | 1,278.08 | 1,593.44 | 315.36 | 1,634.79 | 356.71 | 1,609.45 | 331.37 |
| ජනවාරි 2024 | 1,391.99 | 1,582.55 | 190.56 | 1,621.41 | 229.42 | 1,561.91 | 169.92 |
| පෙබරවාරි | 1,409.78 | 1,499.25 | 89.47 | 1,538.62 | 128.84 | 1,518.69 | 108.91 |
| මාර්තු | 1,357.32 | 1,446.92 | 89.60 | 1,038.53 | (318.79) | 1,259.45 | (97.87) |

ප්‍රස්තාරය – 17

### කළුබෝවිටියාන කර්මාන්තශාලාව (රු.)




ප්‍රස්තාරය – 18

### දැරංගල කර්මාන්තශාලාව (රු.)




ප්‍රස්තාරය – 19

### හිනිදුම හිල්ස් කර්මාන්තශාලාව (රු.)



පහතරට උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳීම

## මැදි වගා උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳීම

වගුව – 16

| මාසය | පහතරට සාමාන්‍යය (රු.) | මාසික සාමාන්‍යය | |
|---|---|---|---|
| | | මැණික්දිවෙල (රු.) | විචලනය |
| අප්‍රේල් 2023 | 1,148.10 | 1,118.86 | (29.24) |
| මැයි | 1,119.62 | 1,057.82 | (61.80) |
| ජූනි | 950.31 | 959.79 | 9.48 |
| ජූලි | 1,113.79 | 932.42 | (181.37) |
| අගෝස්තු | 1,211.51 | 753.84 | (457.67) |
| සැප්තැම්බර් | 1,298.39 | 1,126.44 | (171.95) |
| ඔක්තෝබර් | 1,430.59 | 1,051.31 | (379.28) |
| නොවැම්බර් | 1,161.33 | 1,214.86 | 53.53 |
| දෙසැම්බර් | 1,263.64 | 1,177.34 | (86.30) |
| ජනවාරි 2024 | 1,291.31 | 1,111.64 | (179.67) |
| පෙබරවාරි | 1,203.16 | 1,040.45 | (162.71) |
| මාර්තු | 1,113.98 | 932.92 | (181.06) |

ප්‍රස්තාරය – 20

මැණික්දිවෙල කර්මාන්තශාලාව (රු.)




# සම්මාන හා පිළිගැනුම්

### 2004

ට්‍රාන්ස් වර්ල්ඩ් ගෝල්ඩ් ස්ටාර් සම්මානය
ආර්ථික අධ්‍යයන ආයතනය

### 2005

වර්ෂය සඳහා සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය
ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

### 2009

වර්ෂය සඳහා සීටීසී පහතරට කාණ්ඩයේ වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව

LCBL ප්‍රගතියේ ඇගයූ පාර්ශවකරු

### 2011

වර්ෂය සඳහා සමස්ත ලංකා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව- ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

සීටීසී පහතරට කාණ්ඩයේ වර්ෂය සඳහා ඉහළම විකුණුම් සාමාන්‍යය ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා කළු තේ කාණ්ඩයේ සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (Off Grade) ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (PD කාණ්ඩය) ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

2වන කාර්තුවේ ඉහළම ශුද්ධ විකුණුම් සාමාන්‍යය වූ 434.1 ඒෂියා සියාකා

### 2012

වර්ෂය සඳහා සමස්ත ලංකා ඉහළම විකුණුම් සාමාන්‍යය ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

වර්ෂය සඳහා වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව (PD කාණ්ඩය) ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

### 2014

සීටීසී පහතරට කාණ්ඩයේ වර්ෂය සඳහා ඉහළම විකුණුම් සාමාන්‍යය – ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්

### 2015

ඩුබායිහි පැවැති තරගයේදි වසරේ හොඳම ලංකා වතු තේ සම්මානලාභී (ශ්‍රේණිය - PF1) ශ්‍රී ලංකා තේ මණ්ඩලය

ඩුබායිහි පැවැති තරගයේදි වසරේ හොඳම ලංකා වතු තේ සම්මානලාභී (ශ්‍රේණිය - BP1) ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2017

හොඳම තේ කර්මාන්ත ශාලාව කලාපීය මට්ටම
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

හොඳම තේ කර්මාන්ත ශාලාව කලාපීය මට්ටම
ජාතික තේ සම්මාන උළෙල

චිනයේ පැවැති වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ තරගයේ අවසන් වටයට තේරීම - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2022

වාර්තාගත ඉහළම මිල- ජෝන් කීල්ස්

මූල්‍ය රෙගුලාසිවලට අනුකූලවන සාර්ථක රාජ්‍ය ව්‍යාපාරය ගැනුම්කරු - යුනිවර්ල්ඩ් ටීස්



# ඉහළම මිල ගණන් 2023-24

වගුව – 17

| විකුණුම් දිනය | විකුණුම් අංකය | PF1 | | | P-Dust | | | BP1 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | තැරැව්කරු | ඉන්වොයිසි අංකය | මිල (රු.) | තැරැව්කරු | ඉන්වොයිසි අංකය | මිල (රු.) | තැරැව්කරු | ඉන්වොයිසි අංකය | මිල (රු.) |
| 1. 2023.04.03 | 14 | CTB | 711 | 1,400.00 | - | - | - | - | - | - |
| 2. 2023.04.18 | 15 | JK | 734 | 1,420.00 | - | - | - | - | - | - |
| 3. 2023.04.18 | 15 | - | - | - | MRC | 735 | 1,400.00 | - | - | - |
| 4. 2023.05.16 | 19 | F&W | 783 | 1,200.00 | - | - | - | - | - | - |
| 5. 2023.05.30 | 21 | CTB | 22 | 1,180.00 | - | - | - | - | - | - |
| 6. 2023.05.30 | 21 | ASIA | 40 | 1,180.00 | - | - | - | - | - | - |
| 7. 2023.05.30 | 21 | MRC | 29 | 1,180.00 | - | - | - | - | - | - |
| 8. 2023.05.30 | 21 | LCBL | 32 | 1,180.00 | - | - | - | - | - | - |
| 9. 2023.06.06 | 22 | - | - | - | - | - | - | CTB | 61 | 1,000.00 |
| 10. 2023.06.23 | 24 | FW | 69 | 1,220.00 | - | - | - | - | - | - |
| 11. 2023.06.23 | 24 | MRC | 80 | 1,220.00 | - | - | - | - | - | - |
| 12. 2023.06.23 | 24 | ASIA | 82 | 1,220.00 | - | - | - | - | - | - |
| 13. 2023.07.04 | 26 | FW | 99 | 1,240.00 | - | - | - | - | - | - |
| 14. 2023.07.04 | 26 | FW | 111 | 1,240.00 | - | - | - | - | - | - |
| 15. 2023.07.04 | 26 | CTB | 109 | 1,240.00 | - | - | - | - | - | - |
| 16. 2023.07.04 | 26 | BL | 103 | 1,240.00 | - | - | - | - | - | - |
| 17. 2023.07.04 | 26 | BL | 108 | 1,240.00 | - | - | - | - | - | - |
| 18. 2023.07.04 | 26 | MRC | 105 | 1,240.00 | - | - | - | - | - | - |
| 19. 2023.07.11 | 27 | - | - | - | - | - | - | FW | 127 | 1,180.00 |
| 20. 2023.07.31 | 30 | - | - | - | MRC | 175 | 1,260.00 | - | - | - |
| 21. 2023.08.22 | 33 | - | - | - | MRC | 203 | 1,500.00 | - | - | - |
| 22. 2023.08.28 | 34 | - | - | - | MRC | 216 | 1,380.00 | - | - | - |
| 23. 2023.09.05 | 35 | - | - | - | MRC | 242 | 1,360.00 | - | - | - |
| 24. 2023.09.13 | 36 | - | - | - | MRC | 256 | 1,380.00 | - | - | - |
| 25. 2023.09.13 | 36 | - | - | - | - | - | - | ASIA | 241 | 1,420.00 |
| 26. 2023.10.17 | 41 | ASIA | 323 | 1,650.00 | - | - | - | - | - | - |
| 27. 2023.11.08 | 44 | - | - | - | BL | 368 | 1,380.00 | - | - | - |
| 28. 2023.11.14 | 45 | JK | 369 | 1,550.00 | - | - | - | - | - | - |
| 29. 2023.11.14 | 45 | ASIA | 370 | 1,550.00 | - | - | - | - | - | - |
| 30. 2023.11.14 | 45 | FW | 371 | 1,550.00 | - | - | - | - | - | - |
| 31. 2023.11.14 | 45 | BL | 372 | 1,550.00 | - | - | - | - | - | - |
| 32. 2023.11.21 | 46 | ASIA | 386 | 1,550.00 | - | - | - | - | - | - |
| 33. 2023.11.21 | 46 | ASIA | 398 | 1,550.00 | - | - | - | - | - | - |









වගුව – 17

| විකුණුම් දිනය | විකුණුම් අංකය | PF1 | | | P-Dust | | | BP1 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | තැරැව්කරු | ඉන්වොයිසි අංකය | මිල (රු.) | තැරැව්කරු | ඉන්වොයිසි අංකය | මිල (රු.) | තැරැව්කරු | ඉන්වොයිසි අංකය | මිල (රු.) |
| 34. 2023.11.21 | 46 | FW | 387 | 1,550.00 | - | - | - | - | - | - |
| 35. 2023.11.21 | 46 | BL | 394 | 1,550.00 | - | - | - | - | - | - |
| 36. 2023.11.21 | 46 | MRC | 391 | 1,550.00 | - | - | - | - | - | - |
| 37. 2023.11.21 | 46 | MRC | 397 | 1,550.00 | - | - | - | - | - | - |
| 38. 2023.11.21 | 46 | CTB | 390 | 1,550.00 | - | - | - | - | - | - |
| 39. 2023.11.21 | 46 | CTB | 396 | 1,550.00 | - | - | - | - | - | - |
| 40. 2023.11.21 | 46 | JK | 392 | 1,550.00 | - | - | - | - | - | - |
| 41. 2023.11.21 | 46 | - | - | - | MRC | 384 | 1,320.00 | - | - | - |
| 42. 2023.12.05 | 48 | JK | 424 | 1,650.00 | - | - | - | - | - | - |
| 43. 2023.12.05 | 48 | ASIA | 432 | 1,650.00 | - | - | - | - | - | - |
| 44. 2023.12.13 | 49 | CTB | 436 | 1,650.00 | - | - | - | - | - | - |
| 45. 2023.12.13 | 49 | CTB | 443 | 1,650.00 | - | - | - | - | - | - |
| 46. 2023.12.13 | 49 | JK | 438 | 1,650.00 | - | - | - | - | - | - |
| 47. 2023.12.13 | 49 | JK | 447 | 1,650.00 | - | - | - | - | - | - |
| 48. 2023.12.13 | 49 | ASIA | 439 | 1,650.00 | - | - | - | - | - | - |
| 49. 2023.12.13 | 49 | ASIA | 445 | 1,650.00 | - | - | - | - | - | - |
| 50. 2023.12.13 | 49 | BL | 441 | 1,650.00 | - | - | - | - | - | - |
| 51. 2023.12.13 | 49 | BL | 437 | 1,650.00 | - | - | - | - | - | - |
| 52. 2024.01.10 | 2 | ASIA | 480 | 1,650.00 | - | - | - | - | - | - |
| 53. 2024.01.10 | 2 | ASIA | 485 | 1,650.00 | - | - | - | - | - | - |
| 54. 2024.01.10 | 2 | FW | 481 | 1,650.00 | - | - | - | - | - | - |
| 55. 2024.01.10 | 2 | JK | 482 | 1,650.00 | - | - | - | - | - | - |
| 56. 2024.01.10 | 2 | LCBL | 487 | 1,650.00 | - | - | - | - | - | - |
| 57. 2024.01.16 | 3 | ASIA | 496 | 1,700.00 | - | - | - | - | - | - |
| 58. 2024.01.22 | 4 | ASIA | 515 | 1,650.00 | - | - | - | - | - | - |
| 59. 2024.02.07 | 6 | FW | 539 | 1,600.00 | - | - | - | - | - | - |
| 60. 2024.02.07 | 6 | FW | 549 | 1,600.00 | - | - | - | - | - | - |
| 61. 2024.02.07 | 6 | - | - | - | BL | 528 | 1,360.00 | - | - | - |
| 62. 2024.02.20 | 8 | FW | 570 | 1,500.00 | - | - | - | - | - | - |
| 63. 2024.02.20 | 8 | FW | 576 | 1,500.00 | - | - | - | - | - | - |
| 64. 2024.02.28 | 9 | - | - | - | JK | 598 | 1,420.00 | - | - | - |
| 65. 2024.03.12 | 11 | FW | 610 | 1,500.00 | - | - | - | - | - | - |
| 66. 2024.03.12 | 11 | FW | 621 | 1,500.00 | - | - | - | - | - | - |

# ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්






# අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

## කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2024 මාර්තු 31 න් අවසන් සමාලෝචිත වසර සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමගින් අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අවසන් කර නොමැති බැවින් 2024 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකවරයාගේ වාර්තාව සපයා නොමැත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණකවරයාගේ වාර්තාව අවසන් කිරීමෙන් පසු, අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවා සම්මත කර ගැනීම සඳහා කොටස් හිමියන් අතර බෙදා හරිනු ලැබේ.

**සාරාංශගත මූල්‍ය තත්ත්වය:**

සාරාංශගත මූල්‍ය තත්ත්වය පහත දැක්වෙන පරිදි වේ.

වගුව – 18

| මාර්තු 31න් අවසන් වසර සඳහා | 2024 (රු.) | 2023 (රු.) |
|---|---|---|
| ආදායම | 1,802,165,017 | 2,635,413,672.26 |
| විකුණුම් පිරිවැය | 1,747,661,088.10 | (2,285,165,803) |
| **දළ ලාභය** | **154,503,929.21** | **350,247,869** |
| වෙනත් මෙහෙයුම් ආදායම | 49,849:950.33 | 60.406,357 |
| **මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය** | **104,353,879.54** | **410,654,226** |
| පරිපාලන වියදම් | (63,425,440.50) | (72,369,962) |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | (4,031,338.74) | (1,237,181) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ** | **36,897,100.30** | **337,047,082** |
| මූල්‍ය ආදායම් | 32,494,111.89 | 19,694,965 |
| මූල්‍ය වියදම් | | (9,754,534) |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **32,494,111.89** | **9,940,431** |
| **බදුකරණයට පෙර ශුද්ධ ලාභය** | **69,391,212.19** | **346,987,513** |
| බදුකරණය | (13,816,704.98) | (126,186,738) |
| **බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය** | **55,574,507.21** | **220,800,775** |
| කොටසක් සඳහා ඉපැයුම් | 12.06 | 48 |
| **වෙනත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය** | | |
| බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය | 55,574,507.21 | 220,800,775 |
| දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | 34,400,000.00 | 32,052,654 |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණක ලාභ/(අලාභ) | 1,427,352.00 | 725,235 |
| විලම්බිත බදු ලාභ/(අලාභ) | (10,748,205.60) | (9,833,367) |
| **වසර සඳහා මුළු විස්තීරණ ආදායම** | **80,653,653,61** | **243,745,298** |

## මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිටු 52 සිට 73 තෙක් දක්වා ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු 56 සිට 59 තෙක් දක්වා ඇත. එසේ යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල ප්‍රමාණාත්මක වෙනස්කම් නොමැත.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ

2024 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි විස්තර කොට ඇත.

## මූල්‍ය වර්ෂයෙන් පසුව ඉල්ලා අස්වීම් ලබා දුන් විගණක කමිටු සාමාජිකයන්

ජේ. ඒ. ටී. ඩී. එස්. කුමාර මහත්මිය – සභාපති
(2023 ජූලි 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය)

ජේ. විජේසිංහ මහතා
(2024 මාර්තු 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය)

ඩී. එම්. එම්. දිසානායක මහතා

බී. ඒ. ටී. රොද්‍රිගෝ මහතා
(2023 අගෝස්තු 07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී)

## වර්තමාන විගණන කමිටු සාමාජිකයන්

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මහතා

ඩී. එම්. එම්. දිසානායක මහත්මිය

ඒ. ඒ. විල්සන් මහතා

## මූල්‍ය වර්ෂය තුළ ඉල්ලා අස්වීම් ලබා දුන් අධ්‍යක්ෂවරු

ජේ. ඒ. ටී. ඩී.එස්. කුමාර මහත්මිය
(2023 අගෝස්තු 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි වන පරිදි ඉල්ලා අස්විය)

ඩබ්ලිව්. ඒ. කේ. බී. ටී. කේ. අල්විස් මහතා
(2024 මාර්තු 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ඩී. යූ. අබේසුන්දර මහතා
(2024 මාර්තු 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

ජේ. විජේසිංහ මහතා
(2024 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස්විය)

## මූල්‍ය වර්ෂය තුළ පත් කරන ලද අධ්‍යක්ෂවරුන්

බී. ඒ. ටී. රොද්‍රිගෝ මහතා
(2023 අගෝස්තු 07 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

ඩබ්ලිව්. ජී. ආර්. ඩී. විමලරත්න මහතා
(2024 මාර්තු 01 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

ඩී. එස්. එම්. ජයසේකර මහතා
(2024 මාර්තු 01 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

ආර්. එච්. එස්. ටී. සමරතුංග මහතා
(2024 මාර්තු 01 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී)

## වත්මන් අධ්‍යක්ෂවරුන්

එස්. එස්. සමරසිංහ මහතා – සභාපති

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මහතා

ඩී. එම්. එම්. දිසානායක මිය

එල්. කේ. කොඩිප්පිලි මහතා

කේ. කේ. එස්. මල්වත්ත මහතා

ඒ. ඒ. විල්සන් මහතා

පී. ඩී. එස්. ඒ. ගුණසේකර මහතා

ඩබ්ලිව්. ජී. ආර්. ඩී. විමලරත්න මහතා

## විගණකවරු

සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරන ලද අතර ඔහු නැවත විගණක ලෙස පත්කර ඇත. 2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඔවුන් නැවැත පත්කිරීම හා ඔවුන්ගේ පාරිශ්‍රමිකය තීරණය කිරිමට අධ්‍යක්ෂවරුන්ට බලය පවරන යෝජනාවක් එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී යෝජනා කරනු ඇත.

සමාගම විසින් විගණන ගාස්තු ලෙස රු. 700,000 ක් ගෙවන ලදී.

අධ්‍යක්ෂවරුන් දන්නා තරමට ඉහත විස්තර කර ඇති ඒවා හැරණු විට විගණකවරුන්ට සමාගම සමග කිසිදු සබඳතාවක් (විගණකවරයකු ලෙස හැර) නොමැත. විගණකවරුන්ට සමාගම සමග කිසිඳු බැඳියාවක් නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ | අධ්‍යක්ෂ | ලේකම්වරු

2025 අප්‍රේල් 11 වැනි දින කොළඹදීය





# විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජයට අයත් ව්‍යාපාර සඳහා වන ආයතනික පාලන මාර්ගෝපදේශ ප්‍රකාරව විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිතයා විසින් එහි සභාපතිත්වය දරයි.

එම මාර්ගෝපදේශ අනුව, අදාළ සියලු නීති, රෙගුලාසි සහ රජයේ චක්‍රලේඛ සමග අනුකූලතාව අඛණ්ඩව සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම මගින් මූල්‍ය වාර්තාකරණය අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් අදාළ නෛතික අවශ්‍යතාවයන් සමග අනුකූල වන බව සහතික කිරීමේදී විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය යුතුය. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි අභ්‍යන්තර පාලන පද්ධති සහ අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සහ පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ සමාලෝචනය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම ද විගණන කමිටුවේ වගකීම වන්නේය.

## කමිටු රැස්වීම්

සමාලෝචිත වර්ෂයේදී සියලු සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් කමිටුව සිව් වරක් කැඳවනු ලැබූ අතර වත්කම් ආරක්ෂා කිරීම සඳහා පිළිගත හැකි මට්ටමක සහතිකයක් සැපයීමේදී අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්යක්ෂමතාව ඇගයීම සඳහා පවතින පරිපාටි පරීක්ෂා කර බලන ලදී.

වගුව – 19

| කමිටු සාමාජිකයාගේ නම | 2023 ජූලි 10 | 2023 ඔක්තෝබර් 17 | 2023 දෙසැම්බර් 13 |
|---|---|---|---|
| බී. ඒ. ටී. රොද්‍රිගෝ මහතා (ජේ. ඒ. ටී. ඩී. එස්. කුමාර මහත්මියගේ විකල්ප සාමාජික) | ✗ | ✗ | ✓ |
| ජේ. ඒ. ටී. ඩී. එස්. කුමාර මහත්මිය | ✓ | ✓ | ✗ |
| ඩී. එම්. එම්. දිසානායක මහතා | ✓ | ✓ | ✓ |
| ජේ. විජේසිංහ මහතා | ✓ | ✓ | ✓ |

## ආරාධනයෙන් සහභාගිවීම

සභාපති, කළමනාකරණ අධ්‍යක්ෂ, මූල්‍ය අධ්‍යක්ෂ සහ අභ්‍යන්තර විගණන නිලධාරී ආරාධනයෙන් රැස්වීම්වලට සහභාගි විය. ජාතික විගණන කාර්යාලය නියෝජනය කරමින් සහකාර විගණකාධිපති සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක නිලධාරීවරයා නිරීක්ෂකයන් ලෙස රැස්වීම්වලට සහභාගි විය.

## වර්ෂය තුළ කමිටුවේ ක්‍රියාකාරකම්

සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කරන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තා අදාළ පාර්ශවයන්ගේ අනුරූපී ප්‍රතිචාර සමගින් සමාලෝචනය කරන ලදී.

වර්ෂයට අදාළව ජාතික විගණන කාර්යාලය විසින් මතු කරන ලද විගණන විමසුම් සඳහා ඉදිරිපත් කිරීම පිණිස පිළියෙළ කරන ලද පිළිතුරු සමාලෝචනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

විනය ක්‍රියා මාර්ග, කර්මාන්ත ශාලා මෙහෙයුම් සහ තොරතුරු පද්ධතියට අදාළ වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.

ව්‍යාපාරික මෙහෙයුම් වැඩි දියුණු කිරීම පිණිස අවශ්‍ය අවදානම් අවම කිරීමේ ක්‍රියා මාර්ග, අවශ්‍ය පාලන අභ්‍යන්තර පාලන අධීක්ෂණ යාන්ත්‍රණ නිර්දේශ කරන ලදී.

කමිටුවේ යොමුකිරීම් අනුදේශ සියලු ප්‍රමාණාත්මක අංශවල විෂයයන් ආවරණය කරන ලද බව විගණන කමිටුව නිගමනය කරයි.

## විගණන කමිටු සාමාජිකයන්

බී. ඒ. ටී. රොද්‍රිගෝ: සභාපති - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම/අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ජේ.ඒ.ටී.ඩී.එස්. කුමාර මිය: සභා පතිතුමිය - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම / සහාය අධ්‍යක්ෂ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ඩී.එම්.එම්. දිසානායක මිය: සාමාජික - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම /ප්‍රධාන ගණකාධිකාරී, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

ජේ. විජේසිංහ මයා: සාමාජික - අධ්‍යක්ෂ, කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම

# මූල්‍ය වාර්තා

48 විගණක වාර්තාව
52 ලාභ/(අලාභය) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
53 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
54 ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය
55 මුදල් ප්‍රවාහ ප්‍රකාශය
56 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
74 දස අවුරුදු සාරාංශය



# විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඒල්/ඩී/කේටීඑෆ්එල් / 1/2023/2024/04
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2025 මාර්තු 20 දින

සභාපති
**සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්**

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි ("සමාගම") 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකල යුතු වුවද සමාගම විසින් ගෙවිය යුතු වියදම් සහ අත්තිකාරම් හා කලින් ගෙවීම් එකිනෙකට හිලව් කර රු. 22,488,718 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,490,504 ක ආපසු එවූ තොග හා තොග ඌනතාවයන් සමාගමේ වෙළඳ ණයගැති ශේෂය තුළ ඇතුළත් වූ බැවින් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අධිප්‍රමාණය වී තිබුණි.

(ඇ) නිමි තේ ඇසුරුම් ද්‍රව්‍ය මුද්‍රණ ආකෘති සැකැස්ම වෙනුවෙන් දැරූ රු.2,833,151 ක් දේපළ පිරියත උපකරණ යටතේ වත්කමක් වශයෙන් හඳුනාගැනීමකින් තොරව ඉදිරියට කළ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් අධිගණනය වී දේපළ පිරියත උපකරණ වටිනාකම අවප්‍රමාණය වී තිබුණි.

(ඈ) දැරංගල තේ කර්මාන්තශාලාවේ නිමි තේ තොගයේ ඇතුළත්ව තිබූ පිරිවැය රු.8,243,040 ක් පමණ වටිනා තේ කිලෝග්‍රෑම් 5,228 ක් කසළ තේ වශයෙන් හඳුනාගෙන අවසන් නිමි තේ තොගයෙන් ඉවත් කිරීමට 2024 දෙසැම්බර් කටයුතු කර ඇති අතර පවත්නා විගණන සාක්ෂි අනුව මෙම කසළ තේ තොගය 2024 මාර්තු 31 දිනට වූ අවසන් නිමි තේ තොගය තුළද අන්තර්ගත බවට නිරීක්ෂණය වූ බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කර ඇති රු.31,593,130 ක දැරංගල තේ කර්මාන්තශාලාවේ අවසන් නිමි තේ තොගයේ නිවැරදිතාවය සැක සහිතය.

(ඉ) බොල් ණය හා අඩමාණ ණය වෙන්කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් සමාගම තුළ නොතිබුණද රු.1,846,032 ක බොල් ණය හා අඩමාණ ණය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණු අතර වර්ෂ 02 කට අධික කාලයක සිට එම ගිණුමේ ශේෂය නොවෙනස්ව තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සමාගමේ 2023/24 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk





මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකිවූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023/24 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

වගුව – 20

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ජේදය | සමාගමේ මානව සම්පත් කළමනාකරණය ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලිය හා පාලනයන් පිළිබඳව මෙහෙයුම් අත්පොතක් අනුමත කරවාගෙන ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2022 ජුනි 13 දිනැති අංක 257/2022 දරන චක්‍රලේඛය | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ වර්ෂ අවසාන භෞතික තේ තොග සත්‍යාපනයෙන් පසුව කර්මාන්තශාලාවේ නිමි තේ තොගයේ ඇතුළත්ව තිබූ තේ වෙන්දේසියට හෝ දේශීය වෙළෙඳපොලට නිකුත් කිරීමට නියමිත ප්‍රමිතියට ලඟා නොවූ රු.5,358,333 ක් වටිනා තේ කිලෝග්‍රෑම් 4,460 ක් කසළ තේ වශයෙන් නම් කර අවසන් නිමි තේ තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇතත් ඒ පිළිබඳව විගණන කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2022 පෙබරවාරි 18 දිනැති අංක 239/2022 දරන චක්‍රලේඛයේ (එ) ජේදය | තේ අලෙවිසැල මඟින් සිදුකරන ලද දින 30 ට, 60 ට හා 90 වඩා වැඩි මුදල් නොලැබූ විකුණුම් නොපමාව අයකර ගැනීමට සහකාර කළමණාකරු (අලෙවි) හා කළමණාකරු (මූල්‍ය) විසින් වගබලා ගතයුතු වුවද, වර්ෂයකට වැඩි කාලයක් වූ තේ පැකට් අලෙවියෙන් ලැබියයුතු රු.1,837,152 ක විකුණුම් මුදල් විගණිත දින වන විටත් අයකර ගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.





විගණක වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 2.3 වෙනත් කරුණු

(අ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි හෙක්ටයාර් 4.075 ක් වූ ඉඩමෙහි හෙක්ටයාර් 0.802 ක ප්‍රමාණයක 1989 හා 1996 කාලයේ සිට අනවසර පදිංචිකරුවන් 15 දෙනෙකු පදිංචි වී සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඔවුන් ඉවත් කර ඉඩම නිරවුල් කරගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.

(ආ) තේ ශක්ති අරමුදල යටතේ ආරම්භ කරන ලද හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා පිළිවෙලින් 2012 සහ 2015 වර්ෂයන්හිදී සමාගම වෙත මෙහෙයුම් කටයුතු සඳහා පවරා දෙනු ලැබූ අතර සමාගම විසින් තේ ශක්ති අරමුදල වෙත 2015 අප්‍රේල් 09 දින රු. මිලියන 50 ක ණය මුදලක්ද ලබා දී තිබුණි. 2019 මාර්තු 19 දිනැති අංක අමප/19/0743/117/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම මුදල සහ අදාළ පොලිය වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කර්මාන්තශාලාවන්හි නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.

(ඇ) කර්මාන්තශාලා නව තාක්ෂණයට අනුවර්තනය කිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් 2021 වර්ෂයේදී සමාගමට රු.18,204,900 ක් ලැබී තිබුණුද එහි අනුමත ප්‍රසම්පාදන කාර්යයන් අතරින් CTC කටර් මුවහත් කිරීම සඳහා පරිගණකගත තාක්ෂණය හඳුන්වාදීම සහ CTC තේ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම හා ස්ථාපිත කිරීමේ කටයුතු 2024 මාර්තු 31 වන විටත් අවසන් කර නොතිබුණු බැවින් රු.7,620,900 ක ප්‍රදාන සමාගමේ ඉතිරිව පැවතුණි.

(ඈ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 146.05 ක ලාභයක් වාර්තා කර ඇති අතර , එය පසුගිය වර්ෂයේදී වාර්තා කරන ලද රු.මිලියන 360.73 සමඟ සැසඳීමේදී සියයට 60 කින් අඩුවී තිබුණි. හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාවද පසුගිය වර්ෂයේ පැවති රු. මිලියන 1.33 ක ලාභදායිතාවය වෙනුවට රු. මිලියන 30.89 ක අලාභදායී තත්ත්වයෙන් වාර්තාකර තිබුණු අතර දෑරංගල, මැණික්දිවෙල සහ බත්තරමුල්ල වෙළෙඳ සැලයෙහි ද පිළිවෙලින් රු. මිලියන 24.15 ක, රු. මිලියන 35.22 ක සහ රු. මිලියන 1.27 ක අලාභයන් වාර්තාකර තිබුණි. තේ වල විකුණුම් මිල පහළ යාම, නිෂ්පාදන පිරිවැය ඉහළයාම හා තේ දලු වල ප්‍රමිතිය අඩුවීමෙන් නිමි තේ ප්‍රතිශතය පහත වැටීම මෙම පිරිහීමට හේතුවී තිබුණි.

(ඉ) කළුබෝවිටියාන, දෑරංගල, හිනිදුම හිල්ස්, සහ මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවන්හී වාර්ෂික නිමි තේ නිෂ්පාදන ධාරිතාවය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 1,440,000 ක් 576,000 ක් 516,000 ක් සහ 300,000 ක් වුවද සමාලෝචිත වර්ෂයෙහි නිමි තේ නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 858,881 ක් 208,325 ක් 109,986 ක් හා 174,545 ක් වූයෙන් එම කර්මාන්තශාලාවන්හී ධාරිතා ඌන උපයෝජනය සියයට 40 ත් 79 වැනි ඉහළ අගයන් ගෙන තිබුණි.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
විගණකාධිපති

# කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

වගුව – 21

| **මාර්තු 31න් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම** | **සටහන** | **2024 (රු.)** | **2023 (රු.)** |
|---|---|---|---|
| ආදායම | 03 | 1,802,165,017.30 | 2,635,413,672 |
| විකුණුම් පිරිවැය | 04 | (1,747,661,088.10) | (2,285,165,803) |
| ලංකා බැංකුව | ගිණුම් අංකය 75958665 – පැලවත්ත | 24,000.00 | 25,000 |
| ලංකා බැංකුව | ගිණුම් අංකය 205604 – තවලම | 15,000.00 | 15,000 |
| මහජන බැංකුව | ගිණුම් අංකය 256100110021039 – පිළිමතලාව | - | - |
| මහජන බැංකුව | මහජන බැංකුව – ගිණුම් අංකය 208100100084885 – බත්තරමුල්ල | (6,900,431.65) | 155,351,001 |
| ඉතිරිකිරීමේ ගිණුම් – මහජන බැංකුව | | - | 9,542,597 |
| අතැති මුදල් | | - | - |
| මාර්ගස්ථ මුදල් | | 1,256,889.45 | 515,877 |
| **එකතුව** | | **(5,539,275.65)** | **167,631,145** |

## 17. ප්‍රකාශිත ප්‍රාග්ධනය

වගුව – 51

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| **නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවන ලද** | | |
| සාමාන්‍ය කොටස් 4,637,507 | 46,375,070.00 | 46,375,070 |
| **එකතුව** | **46,375,070.00** | **46,375,070** |

## 18. සංචිත

වගුව – 52

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| ප්‍රදාන – භාණ්ඩාගාර | - | - |
| ප්‍රාග්ධන සංචිත | 600,000.00 | 600,000 |
| ලාභ/අලාභ ගිණුම | 838,823,507.3 | 821,103,707 |
| **එකතුව** | **839,423,507.31** | **821,703,707** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

## 19. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

වගුව – 53

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|---|
| නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් වටිනාකමේ සංචලන | | | |
| වර්ෂය ආරම්භයේදි | | 24,165,506.17 | 23,837,759 |
| වත්මන් සේවා පිරිවැය | | 2,084,788.25 | 2,290,535 |
| පොළී පිරිවැය | | 4,349,791.18 | 3,575,664 |
| ආයුගණක ලාභ/අලාභ | | 1,427,352.00 | (725,235) |
| පෙර වසර ගැලපීම් | | | |
| වසර තුළ ගෙවීම් | – මුදලින් | 3,135,759.00 | (4,813,216) |
| | – ගෙවිය යුතු | | |
| **වසර අවසානයේදී** | | **26,036,956.17** | **24,165,506** |

## 20. ණය හිමියන් සහ උපචිත ගාස්තු

වගුව – 54

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| තේ දළු සැපයුම්කරුවෝ | 48,738,298.11 | 57,843,653 |
| වෙළඳ ණය හිමියෝ | 15,495,748.06 | 16,086,151 |
| සේවා කොන්ත්‍රාත්කරුවෝ | 2,721,069.60 | 4,515,986 |
| කාර්ය මණ්ඩල ණය හිමියෝ | 3,572,449.66 | 4,779,769 |
| උපචිත වියදම් | 26,133,376.55 | 30,332,725 |
| හිමිකම් නොපෑ ශේෂ | 184,290.49 | 891,481 |
| අනිශ්චිත සහ අනෙකුත් ණය | 3,706,090.54 | - |
| **එකතුව** | **100,551,322.99** | **114,449,764** |

## 21. විලම්බිත බදු වගකීම්/(වත්කම්

වගුව – 55

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| වසර ආරම්භයේදී | 106,580,129.29 | 44,910,997 |
| ආදායම් ප්‍රකාශයට/ඉදිරියෙන් මාරු කළා | - | 51,835,765 |
| ලාභ හා පාඩු ගිණුමෙන්/ගෙන් මාරු කළා | (8,754,246.48) | 9,833,367 |
| **වසර අවසානයේදී** | **97,825,882.81** | **106,580,129** |

## 22. ගෙවියයුතු/ලැබියයුතු ආදායම් බදු

වගුව – 56

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| වර්ෂය ආරම්භයේදී ශේෂය | 74,339,010.40 | (6,687,095) |
| වර්ෂය සඳහා ප්‍රතිපාදනය | 33,319,157.07 | 74,350,973 |
| | **107,658,167.47** | **67,663,877** |
| පෙර වසර සඳහා ගෙවීම් | (74,327,048.12) | |
| වර්ෂය සඳහා ගෙවීම් | (3,273,298.00) | |
| දළ | | |
| | **30,057,821.35** | **67,663,877** |
| **බදු ණය** | | |
| ආර්ථික සේවා ගාස්තු | - | 6,687,095 |
| රඳවා ගැනීමේ බද්ද | (1,865,220.99) | (11,962) |
| **ශුද්ධ ගෙවිය යුතු/(ආපසු ගෙවිය යුතු)** | **28,192,600.36** | **74,339,010** |





# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

## 23. ප්‍රාග්ධන බැඳීම්

ශේෂ පත්‍රයේ දිනයට ප්‍රාග්ධන වියදම් බැඳීම් නොමැත

## 24. අනිශ්චිත අවස්ථා

**විභාගවෙමින් පවතින නඩු**

(i) තමන් සේවයෙන් පහ කිරීම අසාධාරණ බව ප්‍රකාශ කරමින් තමන් නැවැත සේවයේ පිහිටුවන ලෙස අධිකරණයෙන් අයදිමින් ජී. හේමචන්ද්‍ර මහතා විසින් සමාගමට එරෙහිව කොටපොළ කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් (නඩු අංක LT/KP/34/18/07) ගොනු කර ඇත.

(ii) කොටපොළ කම්කරු විනිශ්චය සභාව විසින් ලබා දුන් එල්.එස්. විජේමාන්න නඩු අංක T LT/KP/34/19/07 තීන්දුවට එරෙහිව සමාගම මාතර මහාධිකරණයේ අභියාචනා නඩුවක් (HC/AP/232/19)පවරා ඇත.

(iii) කොටපොළ කම්කරු විනිශ්චය සභාව විසින් ලබා දුන් එච්.සී.එල්.පී. හීන්දෙණිය නඩු අංක LT/KP/34/06/2018 තීන්දුවට එරෙහිව සමාගම මාතර මහාධිකරණයේ අභියාචනා නඩුවක් (HC/72/23/APPL) ගොනු කර ඇත.

(iv) මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාවේ සිදුකළ ඉදිකිරීම් සඳහා ඉතිරි ගෙවීම නොගෙවීම සම්බන්ධයෙන් එච්.පී.එස්. ජීවක පෙරේරා මහතා සමාගමට එරෙහිව කඩුවෙල දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කොට ඇත. (නඩු අංකය 5187/M)

(v) මැණික්දිවෙල තේ කර්මාන්ත ශාලාවේ සිදුකළ ඉදිකිරීම් සඳහා ඉතිරි ගෙවීම නොගෙවීම සම්බන්ධයෙන් ටැමරින්ඩ් ට්‍රී පුද්ගලික සමාගම සමාගමට එරෙහිව කඩුවෙල දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් ගොනු කොට ඇත. (නඩු අංකය 5187/M)

(vi) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් එච්. එන්. අයි. මල්කාන්ති මහත්මිය සමාගමට එරෙහිව බත්තරමුල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් (නඩු අංක 01/Add/15/2022) ගොනු කර ඇත.

(vii) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් ටී.ඩබ්ලියු.එම්.එස්.පී. බණ්ඩාර මහතා සමාගමට එරෙහිව බොරැල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් (නඩු අංක: 02/1205/2023) ගොනු කර ඇත.

(viii) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් බී.ජී. නිශාන්ත මහතා (හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව) සමාගමට එරෙහිව ගාල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත. (නඩු අංකය: LT/01/64/2022).

(ix) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් ඩබ්ලියු. ගාමිණී මහත්මිය (හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව) සමාගමට එරෙහිව ගාල්ල කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත. (නඩු අංකය: LT/06/03/2023) ගොනු කර ඇත.

(x) තමන් සේවයෙන් පහකිරීම අසාධාරණ බව අධිකරණය හමුවේ ප්‍රකාශ කරමින් කරවිටගේ විශාද් කුමාර මහත්මිය (දෑරංගල තේ කර්මාන්ත ශාලා සමාගම) සමාගමට එරෙහිව කොටපොළ කම්කරු විනිශ්චය සභාවේ කම්කරු නඩුවක් ගොනු කර ඇත. (නඩු අංකය: LT/KP/34/05/2022).

(xi) සමාගම කුලියට ලබා ගත් බත්තරමුල්ල, නාගහමුල්ල අංක. 56 දරන ගොඩනැගිල්ල සඳහා තැන්පත් කළ කුලී අත්තිකාරම නොපියවීම සම්බන්ධයෙන් වෛද්‍ය සමුද්‍රා තරංගනී කත්‍රිආරච්චි මහත්මියට එරෙහිව සමාගම කඩුවෙල දිසා අධිකරණයේ නඩු අංක 8258/M දරන නඩුව ගොනු කර ඇත.

## 25. වාර්තාකරණ දිනයෙන් පසු සිදුවීම්

කිසිවක් නොමැත

**ප්‍රවර්තන ව්‍යාපාරය**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති/ලංකා ගිණුම්කරණ ප්‍රමිති වෙත මාරුවීම පැහැදිළි කිරීම

## 26. සම්බන්ධිත පාර්ශව අනාවරණ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ආශ්‍රිත සමාගම් සමග ගනුදෙනු සිදුකරනු ලැබුයේ 'අතේ දුරින්' පදනමිනි.

### 26.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMP) සමග ගනුදෙනු

ප්‍රධාන කළමනාකරණ පිරිස් යනු සමාගමේ ක්‍රියාකාරකම් සෘජුව හෝ වක්‍රාකාරයෙන් සැලසුම් කිරීම, මඟ පෙන්වීම සහ පාලනය සඳහා බලතල සහ වගකීම් සහිත පුද්ගලයන් වේ.

ප්‍රධාන කළමනාකරණ පිරිස් වාර්තාකරණ අස්තිත්වයේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සමන්විත වේ.

**26.1.1 ප්‍රධාන කළමනාකරණ පිරිස් වල වන්දි ගෙවීම් ගිණුම් සටහන් 6 එහි අනාවරණය කර ඇත.**

**26.1.2 වර්ෂය තුළදී ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා ණය දී නොමැත.**

**26.1.3 සමීප පවුල් සාමාජිකයන් ඇතුළු ප්‍රධාන කළමනාකරණ කොටස්වල කොටස් දැරීම**

කිසිවක් නොමැත

**26.1.4 අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂවරුන් වන සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම්:**

කිසිවක් නොමැත

### 26.2 සමීප පවුල් සාමාජිකයන් සමග ගනුදෙනු

සමීප පවුල් සාමාජිකයන් යනු සමාගම සමග සිදු කරන සිය ගනුදෙනුවලදී බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කරන හෝ බලපෑමට ලක්විය හැකි අයවළුන් වේ.

වර්ෂය තුළදී සමීප පවුල් සාමාජිකයන් සමග කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

### 26.3 පරිපාලිත සමාගම්, ආශ්‍රිත සම්ගම් සහ හවුල් ව්‍යාපාර සමග ගනුදෙනු:

කිසිවක් නොමැත

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2024 මාර්තු 31න් අවසන් වසර සඳහා

## 27. කර්මාන්ත ශාලා ඛණ්ඩ

### 27.1 විකුණුම්

වගුව – 57

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ<br>කර්මාන්තශාලා සමාගම | කළුබෝවිටියාන<br>කර්මාන්තශාලාව<br>(රු.) | දැරංගල<br>කර්මාන්තශාලාව<br>(රු.) | හිනිදුම හිල්ස්<br>කර්මාන්තශාලාව<br>(රු.) | මැණික්දිවෙල<br>කර්මාන්තශාලාව<br>(රු.) | අලෙවි<br>මධ්‍යස්ථානය<br>(රු.) | එකතුව<br>(රු.) |
|---|---|---|---|---|---|---|
| දළ විකුණුම් | 1,234,264,276.28 | 271,881,329.20 | 152,309,252.52 | 113,547,500.00 | - | 1,772,002,358.00 |
| අඩුකළා: තැරව්කාර ගාස්තු සහ විකුණුම් වියදම් | (15,227,157.57) | (3,874,547.80) | (2,201,639.36) | (1,850,452.54) | - | (23,153,797.27) |
| | **1,219,037,118.71** | **268,006,781.40** | **150,107,613.16** | **111,697,047.46** | **-** | **1,748,848,560.73** |
| එකතු කළා/අඩුකළා – අන්තර් කර්මාන්තශාලා ගනුදෙනු | | | | | | |
| එකතු ගළා: දේශීය විකිණීම් | 23,270,749.79 | 7,309,512.74 | 642,082.18 | 3,938,563.41 | 18,155,548.45 | 53,316,456.57 |
| **එකතුව** | **1,242,307,868.50** | **275,316,294.14** | **150,749,695.34** | **115,635,610.87** | **18,155,548.45** | **1,802,165,017.30** |

### 27.2 විකුණුම් පිරිවැය

වගුව – 58

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ<br>කර්මාන්තශාලා සමාගම | කළුබෝවිටියාන<br>කර්මාන්තශාලාව<br>(රු.) | දැරංගල<br>කර්මාන්තශාලාව<br>(රු.) | හිනිදුම හිල්ස්<br>කර්මාන්තශාලාව<br>(රු.) | මැණික්දිවෙල<br>කර්මාන්තශාලාව<br>(රු.) | අලෙවි<br>මධ්‍යස්ථානය<br>(රු.) | එකතුව<br>(රු.) |
|---|---|---|---|---|---|---|
| මිලදීගත් දළු | 845,295,247.22 | 232,967,648.25 | 111,430,353.68 | 100,943,864.93 | - | 1,290,637,114.08 |
| **නිෂ්පාදනය කිරීමේ පිරිවැය** | | | | | | |
| නිෂ්පාදන පිරිවැය | 143,468,426.17 | 54,477,682.18 | 33,069,809.78 | 32,740,915.92 | 20,097,865.00 | 283,854,699.05 |
| පොදු ගාස්තු | 49,676,070.02 | 31,593,130.30 | 21,595,347.26 | 16,273,644.96 | - | 119,138,192.54 |
| | **1,038,439,743.41** | **319,038,460.73** | **166,095,510.72** | **149,958,425.81** | **20,097,865.00** | **1,693,630,005.67** |
| එකතු කළා: ආරම්භක තොග | 139,008,586.57 | 50,844,175.72 | 38,636,411.41 | 22,692,403.09 | 894,153.64 | 252,075,730.43 |
| අඩු කළා: අවසන් තොග | (81,191,587.93) | (70,408,656.36) | (23,086,556.02) | (21,794,359.51) | (1,563,488.18) | (198,044,648.00) |
| **එකතුව** | **1,096,256,742.05** | **299,473,980.09** | **181,645,366.11** | **150,856,469.39** | **19,428,530.46** | **1,747,661,088.10** |
| ලාභය/ (අලාභය) | 146,051,126.45 | (24,157,685.95) | (30,895,670.77) | (35,220,858.52) | (1,272,982.01) | 54,503,929.21 |



# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2024 මාර්තු 31 දිනට

## 1. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

### 1.1 වෙළඳ ණයගැතියෝ

වගුව – 59

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| දළු සැපයුම්කරුවන්ගේ ණය | 1,158,856.44 | 1,167,768 |
| මිලදී ගත් දළු ප්‍රවාහන ණය | 456,539.05 | 174,771 |
| පොහොර ණයගැතියෝ | 50,875.00 | 38,833 |
| ගෙවිය යුතු ගිණුම් | - | 4,248,725 |
| වෙළඳ ණයගැතියෝ | 42,918,167.83 | 45,447,295 |
| **උප එකතුව** | **44,584,438.32** | **51,077,392** |

### 1.2 කාර්ය මණ්ඩල ණයගැතියෝ

වගුව – 60

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| චෙක්රෝල් ණය | 3,189.25 | 16,080 |
| ආපදා ණය | 10,568,070.55 | 681,978 |
| උත්සව අත්තිකාරම් | 7,000.00 | 613,000 |
| කාර්යමණ්ඩල ණයගැතියෝ | 251,769.46 | 273,564 |
| ලැබිය යුතු උපයනවිට ගෙවීම් බදු | 2,400.00 | 2,400 |
| **උප එකතුව** | **10,832,429.26** | **1,587,022** |

### 1.3 තැන්පතු

වගුව – 61

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| තැන්පතු ලැබීම් | 2,726,500.00 | 4,608,124 |
| **උප එකතුව** | **2,726,500.00** | **4,608,124** |

### 1.4 පූර්ව ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ

වගුව – 62

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| ලැබිය යුතු ගිණුම් | 22,488,718.27 | - |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය | 13,375,202.61 | 17,191,445 |
| ලැබිය යුතු දේශීය විකුණුම් | 45,561.00 | - |
| තේ පැකට් නිෂ්පාදනය | - | 2,207,821 |
| තේ අලෙවි මධ්‍යස්ථානය | 208,073.00 | - |
| විවිධ අවකරණ /බැංකු ප්‍රේෂණ | - | 145,152 |
| අනෙකුත් අත්තිකාරම් | - | 370,180 |
| පූර්ව ගෙවීම් | 5,938,490.44 | 4,173,405 |
| ගම්මිරිස් වගා කිරීමේ ව්‍යාපෘතිය | - | 15,900 |
| ඉඟුරු වගා කිරීමේ ව්‍යාපෘතිය | - | 70,320 |
| කෙසෙල් වගා කිරීමේ ව්‍යාපෘතිය | - | 92,820 |
| මුද්දර | 4,745.50 | 2,781 |
| විවිධ ණයගැතියෝ | 3,889,961.04 | 3,300,904 |
| කසළ තේ සැපයුම්කරුවෝ | 660,333.60 | 1,231,750 |
| **උප එකතුව** | **46,611,085.46** | **28,802,478** |

### 1.5 වල නොවන ශේෂ

වගුව – 63

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| ටී.ජී. හේමචන්ද්‍ර | 27,258.70 | 27,259 |
| සීඅයිසී පොහොර | 1,446,850.00 | - |
| **උප එකතුව** | **1,474,108.70** | **27,259** |

# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2024 මාර්තු 31 දිනට

### 1.6 අනෙකුත් හර ශේෂ

වගුව – 64

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| විවිධ අවකරණ /බැංකු ප්‍රේෂණ | - | - |
| උප එකතුව | - | - |
| මුළු එකතුව | 106,228,561.74 | 86,102,276 |
| බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනය | - 1,846,031.76 | (1,846,032) |
| **ශුද්ධ එකතුව** | **104,382,529.98** | **84,256,245** |

## 2. ණය හිමියෝ සහ උපචිත ගාස්තු

### 2.1 මිලදී ගත් දළු සැපයුම්කරුවෝ

වගුව – 65

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| මිලදී ගත් දළු සැපයුම්කරුවෝ | 48,738,298.11 | 57,843,653 |
| **උප එකතුව** | **48,738,298.11** | **57,843,653** |

### 2.2 වෙළඳ ණය හිමියෝ

වගුව – 66

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| බැංකු ණය | 1,000.00 | 1,000 |
| දර කොන්ත්‍රාත්කරුවෝ | - | 41,400 |
| හේලික්ස් ඉංජිනියරින් | 40,871.68 | 40,872 |
| ජයසිංහ සහ සමාගම | - 34,000.00 | 106,000 |
| දළු මලු ඇතුරුම් කොන්ත්‍රාත්කරුවෝ | 86,345.72 | |
| බිසිසී ලංකා ආයතනය වෙත ගෙවිය යුතු කුලී මුදල් | 750,000.00 | 750,000 |
| නොගෙවූ අමු දළු සැපයුම්කරුවෝ | 56,353.14 | 53,707 |
| ගෙවියයුතු රඳවාගැනීම් | 70,000.04 | 70,000 |
| විවිධ ණයහිමියෝ | 1,540,537.87 | 1,677,593 |
| අනෙකුත් සැපයුම්කරුවෝ | 12,145,864.05 | 13,109,022 |
| වෙළඳ ණය හිමියෝ | 838,775.56 | 236,556 |
| තනුජා හාඩ්වෙයාර් | - | - |
| **උප එකතුව** | **15,495,748.06** | **16,086,150** |

### 2.3 සේවා කොන්ත්‍රාත්කරුවන් සඳහා ගෙවීම්

වගුව – 67

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| අමු තේ දළු ප්‍රවාහනය | 2,721,069.60 | 4,515,986 |
| **උප එකතුව** | **2,721,069.60** | **4,515,986** |

### 2.4 කාර්යමණ්ඩල ණයගැතියෝ

වගුව – 68

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| චෙක් රෝල්/ අනියම් වැඩ | 2,059,179.99 | 2,769,994 |
| නිවාඩු දින වේතන සඳහා ප්‍රතිපාදන | - | 615,130 |
| ගෙවිය යුතු වැටුප් | 776,679.59 | 313,092 |
| කාර්ය මණ්ඩල අතිකාල දීමනා/ ගමන් වියදම් | 736,590.08 | 598,680 |
| දිරිගැන්වීමේ ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදනය | - | - |
| ගෙවිය යුතු පාරිතෝෂික | - | 482,872 |
| **උප එකතුව** | **3,572,449.66** | **4,779,768** |





# මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන

2024 මාර්තු 31 දිනට

### 2.5 උපචිත වියදම්

වගුව – 69

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| ගෙවිය යුතු විගණන ගාස්තු | 1,400,000.00 | 700,000 |
| මිලදි ගත් දළු සැපයුම්කරුවන්ගේ ගෙවිය යුතු තැන්පතු | 3,399,136.20 | 5,008,148 |
| සමස්ත ලංකා වතු සේවක සංගමය (ACEW) | 600.00 | 1,100 |
| ලංකා වතු කාර්ය මණ්ඩල සංගමය (CESU) | 20,906.00 | 18,406 |
| සමුපකාර සමිතිය යටිනුවර | 84,099.53 | 84,100 |
| ගෙවිය යුතු තැන්පතු | 373,650.00 | 241,650 |
| සේවක අර්ථසාධක අරමුදල | 2,664,215.15 | 4,894,150 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 403,793.84 | 239,385 |
| ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතිය | 30,071.72 | 70,183 |
| නිවාඩු දින සඳහා ගෙවීම් | 583,492.02 | 145,398 |
| තේ පැකට් නිෂ්පාදනය | - | 210,311 |
| රක්ෂණ ගාස්තු | 51,027.23 | 51,027 |
| ලාෆ් පෙට්රෝලියම් | 76,230.00 | 169,851 |
| අනෙකුත් උපචිත වියදම් | 8,501,561.18 | 9,309,805 |
| උපයනවිට ගෙවීම් බදු අධිභාරය | 59,344.00 | 59,344 |
| ඉදිරියට ගෙන ආවා කාසි | - | (1,265) |
| ආපසු එවනලද චෙක්පත් | 3,282,498.48 | 3,293,677 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 48,382.74 | 74,707 |
| රන්මීර් හෝල්ඩිං | 61,566.39 | 61,566 |
| තේ ශක්ති අරමුදල | 2,200.00 | - |
| ගෙවිය යුතු අනෙකුත් කාර්ය මණ්ඩල වියදම් | - | 2,169,076 |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 3,659,250.00 | 1,888,000 |
| යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 960,000.00 | 960,000 |
| ගෙවිය යුතු උපයනවිට ගෙවීම් බද්ද | 79,132.20 | 85,492 |
| ගෙවිය යුතු රඳවාගැනීමේ බදු | 35,400.00 | 35,400 |
| සුභසාධක සංගමය | 43,500.00 | 20,000 |
| රන්දළු සුබසාධක සංගමය | 297,919.87 | 271,270 |
| කර්මාන්ත ශාලා සුබසාධක සංගමය | 15,400.00 | 271,941 |
| **උප එකතුව** | **26,133,376.55** | **30,332,725** |

### 2.6 අනෙකුත් ණය

වගුව – 70

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| ඉතිරි කාසි | (1,179.02) | |
| දිරිගැන්වීම් ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන | 923,000.00 | |
| ගෙවියයුතු පාරිතෝෂික | 1,224,902.80 | |
| වැට් පාලන | 1,559,366.76 | |
| **උප එකතුව** | **3,706,090.54** | **-** |

### 2.7 හිමිකම් නොපෑ ශේෂ

වගුව – 71

| මාර්තු 31 දිනට<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | 2024<br>(රු.) | 2023<br>(රු.) |
|---|---|---|
| චෙක්රෝල් වේතන | 125,556.94 | 144,171 |
| වැටුප් හා වේතන | 19,731.64 | 358,934 |
| කාර්ය මණ්ඩල වැටුප් | 12,041.60 | 361,417 |
| ප්‍රසාද දීමනා | 26,960.31 | 26,960 |
| **උප එකතුව** | **184,290.49** | **891,481** |
| **මුළු එකතුව** | **100,551,323.01** | **114,449,763** |

# පෙර වසර දහයේ විශේෂ මූල්‍ය සිදුවීම්

වගුව – 72

| | 2023-24 | 2022-23 | 2021-22 | 2020-21 | 2019-20 | 2018-19 | 2017-18 | 2016-17 | 2015-16 | 2014-15 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ශුද්ධ විකුණුම් | 1,802,165,017.30 | 2,635,413,672.26 | 1,041,133,241.45 | 1,175,716,247.36 | 937,789,275.06 | 971,792,179.69 | 1,004,319,623.10 | 935,591,884.34 | 775,730,199.81 | 751,044,477.30 |
| විකුණුම් පිරිවැය | (1,747,661,088.10) | (2,285,165,803.52) | (1,026,129,751.47) | (1,158,860,303.57) | (845,680,912.52) | (985,257,848.93) | (983,007,160.69) | (881,617,227.76) | (767,358,579.26) | (737,909,957.50) |
| **දළ ලාභය** | **54,503,929.20** | **350,247,868.74** | **15,003,489.98** | **16,855,943.79** | **92,108,362.54** | **(13,465,669.24)** | **21,312,462.41** | **53,974,656.58** | **8,371,620.55** | **13,134,519.80** |
| වෙනත් ආදායම | 49,849,950.33 | 60,406,357.00 | 20,003,552.09 | 26,749,129.73 | 21,925,980.98 | 24,262,802.24 | 26,091,300.53 | 19,676,356.10 | 43,465,176.11 | 42,923,956.86 |
| **මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය** | **104,353,879.53** | **410,654,225.74** | **35,007,042.07** | **43,605,073.52** | **114,034,343.52** | **10,797,133.00** | **47,403,762.94** | **73,651,012.68** | **51,836,796.66** | **56,058,476.66** |
| **පරිපාලන වියදම්** | | | | | | | | | | |
| විකිණීම සහ බෙදා හැරීම සහ අනෙකුත් වියදම් | (67,456,779) | (73,607,143) | (37,159,299) | (44,560,549) | (51,113,072) | (45,165,514) | (41,116,894) | (33,262,579) | (31,413,580) | (36,183,738) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලාභය** | **36,897,100** | **337,047,083** | **(2,152,257)** | **(955,476)** | **62,921,272** | **(34,368,381)** | **6,286,868** | **40,388,433** | **20,423,217** | **19,874,739** |
| ශුද්ධ මූල්‍ය ආදායම | 32,494,112 | 9,940,431 | (612,515) | (14,189,484) | (19,653,695) | (18,579,650) | (13,219,530) | (9,164,034) | (8,428,981) | (2,885,464) |
| **බදුකරණයට පෙර ශුද්ධ ලාභය** | **69,391,212** | **346,987,514** | **(2,764,772)** | **(15,144,959)** | **43,267,577** | **(52,948,031)** | **(6,932,661)** | **31,224,400** | **11,994,236** | **16,989,274** |
| ආදායම් බදු | (13,816,705) | (126,186,738) | (4,533,980) | 1,001,557 | (5,535,371) | 4,167,928 | (654,698) | (1,723,391) | (2,178,708) | (3,851,962) |
| **බදුකරණයෙන් පසු ශුද්ධ ලාභය** | **55,574,507** | **220,800,776** | **(7,298,752)** | **(14,143,403)** | **37,732,205** | **(48,780,102)** | **(7,587,359)** | **29,501,009** | **9,815,528** | **13,137,312** |

# සටහන්

# ආයතනික තොරතුරු

## සමාගමේ නම

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

## සමාගමේ ලියාපදිංචි අංකය

PB 1020

## කාර්යාලය වෙනත් තැනකට රැගෙන යන ලදී

අංක 53, රත්නායක පාර, පැලවත්ත

## නෛතික තත්ත්වය

1992 සැප්තැම්බර් 30 දින සංස්ථාගත කරන ලද ඇපයෙන් සීමිත රාජ්‍ය සමාගමකි.

## දුරකථන අංකය

0112786734 / 0112786469 / 0112786713

## ෆැක්ස් අංකය

0114645279

## විද්‍යුත් තැපැල් ලිපිනය

Office.gen@kalubowitiyanatea.lk

## විගණකවරු

**ජාතික විගණන කාර්යාලය**
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

## සමාගමේ ලේකම්වරු

**ආර්එන්එච් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම**
ආර්එන්එච් මන්දිරය, අංක 622 බී
කෝට්ටේ පාර, කෝට්ටේ

## නීතිඥවරු

**එෆ් ජේ ද සේරම්**
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්
216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

## බැංකුකරුවෝ

මහජන බැංකුව

## අධ්‍යක්ෂ මණ්ඩලය

ශාමින්ද සමරසිංහ මහතා – සභාපති

ආර්. ඒ. එස්. කේ. රණසිංහ මහතා

ඩී. එම්. එම්. දිසානායක මහත්මිය

ඒ. ඒ. විල්සන් මහතා

කේ. කේ. එස්. මල්වත්ත මහතා

එල්. කේ. කොඩිප්පිලි මහතා

## කළමනාකරණය

ටී. ඒ. ඩී. ජේ. සී. තිලකරත්න මහතා – මෙහෙයුම් ප්‍රධානී, කළමනාකරු, කළුබෝවිටියන සීටීසී තේ කර්මාන්ත ශාලාව

පී. දෙහිවලගේ මහතා – මූල්‍ය කළමනාකරු (වැඩබලන)

ගනිඳු පලිහේන මහතා – සහකාර කළමනාකරු – පරිපාලන

සෙව්වන්දි වලකුළුගේ මහත්මිය – සහකාර කළමනාකරු – අලෙවිකරණ

## කර්මාන්තශාලා

**කළුබෝවිටියන CTC කර්මාන්ත ශාලාව**

අබේවිල, කළුබෝවිටියාන
දුරකථන/ෆැක්ස් : 0913 783020
විද්‍යුත් තැපැල : Ktf.gen@kalubowitiyanatea.lk

**හිනිදුම හිල්ස් තේ කර්මාන්ත ශාලාව**

ජැස්මින් වැලි හන්දිය, තවලම
දුරකථන/ෆැක්ස් : 041-7201222
විද්‍යුත් තැපැල : Htf.gen@kalubowitiyanatea.lk

**දැරංගල තේ කර්මාන්ත ශාලාව**

කිරිවැල්කැලේ, පිටබැද්දර
දුරකථන/ෆැක්ස් : 0913 783621
විද්‍යුත් තැපැල : Dtf.gen@kalubowitiyanatea.lk

**මැණික්දිවෙල තේ කම්හල**

තිස්මඩ පාර, මැණික්දිවෙල
දුරකථන/ෆැක්ස් : 081-2069620/21
විද්‍යුත් තැපැල : Mtf.gen@kalubowitiyanatea.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : පීඑල්/බී/කේටීඑෆ්එල්/ 1/2023/2024/04

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2025 මාර්තු 20 දින

L-2413
26 MAR 2025

සභාපති,

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්

**සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 01.ලේකම් , වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය.

02. ලේකම්, මුදල්,ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන සැළසුම් හා සංචාරක අමාත්‍යාංශය.

මගේ අංකය / எனது இல. / My No. : පීඊඑල්/බී/කෝටීඑෆ්එල් / 1/2023/2024/04

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2025 මාර්තු 20 දින

සභාපති

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්

**සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි ("සමාගම") 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි 32 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිලව් නොකල යුතු වුවද සමාගම විසින් ගෙවිය යුතු වියදම් සහ අත්තිකාරම් හා කලින් ගෙවීම් එකිනෙකට හිලව් කර රු. 22,488,718 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.1,490,504 ක ආපසු එවූ තොග හා තොග ඌනතාවයන් සමාගමේ වෙළඳ ණයගැති ශේෂය තුළ ඇතුළත් වූ බැවින් ණයගැතියන් එම ප්‍රමාණයෙන් අධිප්‍රමාණය වී තිබුණි.

(ඇ) නිමි තේ ඇසුරුම් ද්‍රව්‍ය මුද්‍රණ ආකෘති සැකැස්ම වෙනුවෙන් දැරූ රු.2,833,151 ක් දේපළ පිරියත උපකරණ යටතේ වත්කමක් වශයෙන් හඳුනාගැනීමකින් තොරව ඉදිරියට කළ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් අධිගණනය වී දේපළ පිරියත උපකරණ වටිනාකම අවප්‍රමාණය වී තිබුණි.

(ඈ) දැරංගල තේ කර්මාන්තශාලාවේ නිමි තේ තොගයේ ඇතුළත්ව තිබූ පිරිවැය රු.8,243,040 ක් පමණ වටිනා තේ කිලෝග්‍රෑම් 5,228 ක් කසළ තේ වශයෙන් හඳුනාගෙන අවසන් නිමි තේ තොගයෙන් ඉවත් කිරීමට 2024 දෙසැම්බර් කටයුතු කර ඇති අතර පවත්නා විගණන සාක්ෂි අනුව මෙම කසළ තේ තොගය 2024 මාර්තු 31 දිනට වූ අවසන් නිමි තේ තොගය තුළද අන්තර්ගත බවට නිරීක්ෂණය වූ බැවින් මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කර ඇති රු.31,593,130 ක දැරංගල තේ කර්මාන්තශාලාවේ අවසන් නිමි තේ තොගයේ නිවැරදිතාවය සැක සහිතය.

(ඉ) බොල් ණය හා අඩමාණ ණය වෙන්කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් සමාගම තුළ නොතිබුණද රු.1,846,032 ක බොල් ණය හා අඩමාණ ණය වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර තිබුණු අතර වර්ෂ 02 කට අධික කාලයක සිට එම ගිණුමේ ශේෂය නොවෙනස්ව තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකිවූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා

සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | | නිරීක්ෂණ |
| --- | --- | --- |
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය | සමාගමේ මානව සම්පත් කළමනාකරණය ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලිය හා පාලනයන් පිළිබඳව මෙහෙයුම් අත්පොතක් අනුමත කරවාගෙන ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2022 ජුනි 13 දිනැති අංක 257/2022 දරන චක්‍රලේඛය | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවේ වර්ෂ අවසාන භෞතික තේ තොග සත්‍යාපනයෙන් පසුව කර්මාන්තශාලාවේ නිමි තේ තොගයේ ඇතුළත්ව තිබූ තේ වෙන්දේසියට හෝ දේශීය වෙළෙඳපොලට නිකුත් කිරීමට නියමිත ප්‍රමිතියට ළඟා නොවූ රු.5,358,333 ක් වටිනා තේ කිලෝග්‍රෑම් 4,460 ක් කසළ තේ වශයෙන් නම් කර අවසන් නිමි තේ තොගයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇතත් ඒ පිළිබඳව විගණන කමිටුවට හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2022 පෙබරවාරි 18 දිනැති අංක 239/2022 දරන චක්‍රලේඛයේ (එ) ඡේදය | තේ අලෙවිසැල මඟින් සිදුකරන ලද දින 30 ට, 60 ට හා 90 වඩා වැඩි මුදල් නොලැබූ විකුණුම් නොපමාව අයකර ගැනීමට සහකාර කළමණාකරු (අලෙවි) හා කළමණාකරු (මූල්‍ය) විසින් වගබලා ගතයුතු වුවද, වර්ෂයකට වැඩි කාලයක් වූ තේ පැකට් අලෙවියෙන් ලැබියයුතු රු.1,837,152 ක විකුණුම් මුදල් විගණිත දින වන විටත් අයකර ගෙන නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි හෙක්ටයාර් 4.075 ක් වූ ඉඩමෙහි හෙක්ටයාර් 0.802 ක ප්‍රමාණයක 1989 හා 1996 කාලයේ සිට අනවසර පදිංචිකරුවන් 15 දෙනෙකු පදිංචි වී සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඔවුන් ඉවත් කර ඉඩම නිරවුල් කරගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි.

(ආ) තේ ශක්ති අරමුදල යටතේ ආරම්භ කරන ලද හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා පිළිවෙලින් 2012 සහ 2015 වර්ෂයන්හිදී සමාගම වෙත මෙහෙයුම් කටයුතු සඳහා පවරා දෙනු ලැබූ අතර සමාගම විසින් තේ ශක්ති අරමුදල වෙත 2015 අප්‍රේල් 09 දින රු. මිලියන 50 ක ණය මුදලක්ද ලබා දී තිබුණි. 2019 මාර්තු 19 දිනැති අංක අමප/19/0743/117/024 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම මුදල සහ අදාළ පොලිය වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කර්මාන්තශාලාවන්හි නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි.

(ඇ) කර්මාන්තශාලා නව තාක්ෂණයට අනුවර්තනය කිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් 2021 වර්ෂයේදී සමාගමට රු.18,204,900 ක් ලැබී තිබුණුද එහි අනුමත ප්‍රසම්පාදන කාර්යයන් අතරින් CTC කටර් මුවහත් කිරීම සඳහා පරිගණකගත තාක්ෂණය හඳුන්වාදීම සහ CTC තේ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම හා ස්ථාපිත කිරීමේ කටයුතු 2024 මාර්තු 31 වන විටත් අවසන් කර නොතිබුණු බැවින් රු.7,620,900 ක ප්‍රදාන සමාගමේ ඉතිරිව පැවතුණි.

(ඈ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 146.05 ක ලාභයක් වාර්තා කර ඇති අතර , එය පසුගිය වර්ෂයේදී වාර්තා කරන ලද රු.මිලියන 360.73 සමඟ සැසඳීමේදී සියයට 60 කින් අඩුවී තිබුණි. හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාවද පසුගිය වර්ෂයේ පැවති රු. මිලියන 1.33 ක ලාභදායිතාවය වෙනුවට රු. මිලියන 30.89 ක අලාභදායී තත්ත්වයෙන් වාර්තාකර තිබුණු අතර දැරංගල, මැණික්දිවෙල සහ බත්තරමුල්ල වෙළෙඳ සැලයෙහි ද

පිළිවෙලින් රු. මිලියන 24.15 ක, රු. මිලියන 35.22 ක සහ රු. මිලියන 1.27 ක අලාභයන් වාර්තාකර තිබුණි. තේ වල විකුණුම් මිල පහළ යාම, නිෂ්පාදන පිරිවැය ඉහළයාම හා තේ දළු වල ප්‍රමිතිය අඩුවීමෙන් නිමි තේ ප්‍රතිශතය පහත වැටීම මෙම පිරිහීමට හේතුවී තිබුණි.

(ඉ) කළුබෝවිටියාන, දැරංගල, හිනිදුම හිල්ස්, සහ මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවන්හී වාර්ෂික නිමි තේ නිෂ්පාදන ධාරිතාවය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 1,440,000 ක් 576,000 ක් 516,000 ක් සහ 300,000 ක් වුවද සමාලෝචිත වර්ෂයෙහි නිමි තේ නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් 858,881 ක් 208,325 ක් 109,986 ක් හා 174,545 ක් වූයෙන් එම කර්මාන්තශාලාවන්හී ධාරිතා ඌන උපයෝජනය සියයට 40 ත් 79 වැනි ඉහළ අගයන් ගෙන තිබුණි.

ඩබ්ලිව්.පී .සී . වික්‍රමරත්න

විගණකාධිපති




**කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම**

අංක 53, රත්නායක පාර, පැලවත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

දුරකථන අංක: +94 11 278 6734/6469/6713

විද්‍යුත් තැපැල් ලිපිනය: office.gen@kalubowitiyanatea.lk